
# වාර්ෂික වාර්තාව 2013



කොළඹ විශ්වවිද්‍යාලයීය

## පරිගණක අධ්‍යයනායතනය

## කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

## අන්තර්ගතය


දැක්ම සහ මෙහෙවර ........................................ 01

අධ්‍යක්ෂවරයාගේ සමාලෝචනය ........................................ 02

කෙටි බැල්මක් ........................................ 03
UCSC හි පරිදර්ශනය ........................................ 05

පාලනය ........................................ 06

අධ්‍යාපනය ........................................ 08
වැඩසටහන් සහ ශිෂ්‍යයන් ........................................ 08
උපාධි අපේක්ෂක අධ්‍යාපනය ........................................ 08
පශ්චාත් උපාධි අධ්‍යාපනය ........................................ 16
බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ........................................ 17
විදේශීය ශිෂ්‍යයන් ........................................ 20
ආරම්භ කළ නව පාඨමාලා ........................................ 20

පර්යේෂණ ........................................ 21
පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන ........................................ 21
සම්මේලන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු ........................................ 22
ලද සම්මාන ........................................ 23

අධ්‍යයන කාර්ය මණ්ඩලය ........................................ 23
අනධ්‍යයන-කාර්ය මණ්ඩලය: ස්ථිර (P) කොන්ත්‍රාත්තු/පැවරුම් (C/A) ........................................ 24

මූල්‍යය ........................................ 25
පුනරාවර්තන වියදම් ........................................ 25
ප්‍රාග්ධන වියදම් ........................................ 26
ව්‍යාපෘති (දේශීය/විදේශීය අරමුදල් සැපයූ) ........................................ 26
ව්‍යාපෘති වියදම් (දේශීය/විදේශීය අරමුදල් සැපයූ) ........................................ 27
මූල්‍ය ප්‍රගතිය (වියදම්) ........................................ 28
මූල්‍ය ප්‍රගතිය (උපයාගත් ආදායම්) ........................................ 28
මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය ........................................ 28

2013 වර්ෂයේදී ලද යටිතල පහසුකම් ........................................ 29
වෙනත් විස්තර / මෙම වාර්තාවට අදාළ කාර්යසාධනය ........................................ 29

විගණනය කළ මූල්‍ය ප්‍රකාශය 2013 ........................................ 31
විගණකාධිපතිගේ වාර්තාව 2013 වර්ෂය ........................................ 35
2013 විගණකාධිපතිගේ වාර්තාව කෙරෙහි UCSC හි අදහස් දැක්වීම් ........................................ 42

# කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යායනායතනය

## 2013 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ ගිණුම්

දැක්ම සහ මෙහෙවර

---

**දැක්ම පිළිබඳ ප්‍රකාශය**

*හැදෑරීම් සහ පර්යේෂණ තුළින් නව දැණුමේ සීමා මායිම් ඉක්මවා යමින්, පරිගණකකරණයේ ගෝලීය ප්‍රමුඛයකු වීම.*

**මෙහෙවර ප්‍රකාශනය**

*පරිගණක දැනුම වැඩිදියුණු කිරීම සහ ඉහළ නැංවීම, ගෝලීය උපායමාර්ගික සන්ධාන ඇති කර ගැනීම, විෂය ධාරා අතර පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, ව්‍යවසායක නිපුණතා, නායකත්ව ගුණාංග ඇති, සාමාජයීය වශයෙන් වගකියන, ඍජු, අවංක වෘත්තිකයින් බිහි කිරීම සහ රට කලාපය තුළ දැනුමේ කේන්ද්‍රයක් බවට පත් කිරීමට දායක වීම.*

**අරමුණු**

1. පරිගණක අධ්‍යාපනය ඉගැන්වීමේ සහ ඉගෙනුමේ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම
2. පරිගණක අධ්‍යාපනය පිළිබඳ විෂයාන්තර පර්යේෂණවල සීමා පුළුල් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම
3. ව්‍යවසායක නිපුණතා, නායකත්ව ගුණාංග ඇති, අවංක, සමාජයීය වශයෙන් වගකියන වෘත්තිකයින් බිහි කිරීම
4. ඵලදායී වැඩ සහ වෘත්තීය අභිවෘද්ධිය සඳහා හිතකර පරිසරයක් ඇති කර පවත්වා ගෙන යාම
5. ආයතනික ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම
6. තොරතුරු සන්නිවේදන තාක්ෂණය හරහා සමාජය බලගැන්වීම
7. රට දැනුමේ කේන්ද්‍රයක් බවට පත් කිරීම සඳහා කැපීපෙනෙන දායකත්ව ලබා දීම සහ  අවශ්‍ය වෘත්තීය සේවා සැපයීම

පරිගණක විද්‍යා උසස් අධ්‍යායන මධ්‍යස්ථානයක් ලෙස, මෙම ක්ෂේත්‍රයේ නවතම සංවර්ධන සමගින් IT කර්මාන්තයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි මට්ටම්වල ශිෂ්‍යන් පුහුණු කිරීම සඳහා UCSC දිගටම කටයුතු කරගෙන යයි. සංශෝධිත විෂයමාලාව පදනම්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) හරහා පිරිනමන ලද උපාධි වැඩසටහන් හතරක් සඳහා අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් 769 දෙනෙක් බඳවා ගන්නා ලදී. පරිබාහිරව, විද්‍යා උපාධිධාරීන් 1275 දෙනෙකු සඳහා අදාළ වූ විද්‍යාත්මක විෂය පථය තුළ IT භාවිතය පුහුණු කරන ලද අතර ශිෂ්‍යයන් 2,034 දෙනෙකුට බාහිර ශිෂ්‍යයන් ලෙස BIT උපාධිය හැදෑරීමට අවස්ථාව සපයා දෙන ලදී. ශිෂ්‍යයන් 39 දෙනෙකු පර්යේෂණ උපාධි සඳහා ලියාපදිංචි වූ අතර ශිෂ්‍යයන් 303 දෙනෙකු විද්‍යාපති උපාධි සඳහා ලියාපදිංචි පුහුණුව ලැබීය. පසුගිය වර්ෂවල ලියාපදිංචි වූ අයගෙන් 448 දෙනෙකු උපාධි අපේක්ෂක මට්ටමේ සහ දර්ශනපති උපාධිධාරීන් 6 දෙනෙකු ඇතුළුව 128 දෙනෙකු පශ්චාත් උපාධි මට්ටමේ උපාධි සම්පූර්ණ කරන ලදී.

රජය විසින් වැටුප් වැඩි කළ ද UCSC වෙත භාණ්ඩාගාර ප්‍රදානවලින් ලැබුණ පුනරාවර්තන වෙන්කිරීම් අඩු විය. UCSC විසින් අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම පිණිස මිලියන 242ක උත්පාදිත අරමුදල්වලින් මිලියන 88ක් (37%) ක් මුළු වශයෙන් වැය කිරීමට සිදු විය. වෙනත් පුහුණු කිරීමේ ආයතනවලින් වෙන්කොට හඳුනා ගැනීම පිණිස පර්යේෂණ හරහා නව දැනුම නිර්මාණය කිරීම කෙරෙහි UCSC වැඩි අවධානයක් යොදන ලදී. කාර්ය මණ්ඩලය විසින් සම්මන්ත්‍රණ සහ ජර්නල් පත්‍ර 70 ක් ප්‍රකාශයට පත් කරන ලදී. තවද UCSC රාජ්‍ය අමාත්‍යාංශ සහ වෙනත් ආයතන වෙනුවෙන් උපදේශන ව්‍යාපෘති සිදු කිරීමද දිගටම කරගෙන යන ලදී. වෙනත් වාණිජ නිපැයුම් 46ක් පරාජය කරමින් සමස්ත ජාතික හොඳම තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්මානය දිනා ගනිමින් කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් අඛණ්ඩව සාර්ථකත්වයට පත්වූහ. ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලය විසින් ජාතික සහ ජාත්‍යන්තර තරඟවලදී සම්මාන 22ක් දිනා ගනිමින් පශ්චාත් උපාධි පර්යේෂණ සම්බන්ධව ඉතා උසස් ප්‍රමිති පවත්වා ගන්නා ලදී. පාසැල් දරුවන් ඉලක්ක කරගෙන ග්‍රාමීය ප්‍රදේශවලට ඔවුන්ගේ IT අත දීමේ වැඩසටහන්වල ශිෂ්‍යයන් දිගටම නියැලෙන අතරතුර, සමාජයට ඔවුන්ගේ දායකත්වය ලෙස කාර්ය මණ්ඩලය බොහෝ බාහිර කමිටු, මණ්ඩල සහ වෘත්තීය සංවිධානයන් සමග සම්බන්ධ වීම දිගටම කරගෙන යන ලදී.

නව මාර්ග හඳුනා ගැනීමට අපේ ක්‍රමෝපාය සැලසුම සමාලෝචනය කරන ලදී. 21වැනි සියවස සඳහා උසස් අධ්‍යාපනය (HETC) යන මුල්පිරීම හරහා බාහිර උපාධිය සහ පර්යේෂණ වාණිජකරණය සඳහා යෝජිත වැඩකටයුතු සාර්ථකව අඛණ්ඩව කර ගෙන යන ලදී. සියලු විශ්වවිද්‍යාලවලදී ශිෂ්‍යයින් 13,814 දෙනෙක් සඳහා පවත්වන ලද ශිෂ්‍යයන්ගේ තොරතුරු තාක්ෂණ නිපුණතා පරීක්ෂණය, විශ්වවිද්‍යාලවලට තෝරා ගැනීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා වෙන් කිරීමේ පද්ධතිය වැනි HETC අරමුදල් සැපයූ වැඩසටහන් සහ වෙනත් අභියෝගාත්මක ව්‍යාපෘතිවලට UCSC විසින් අඛණ්ඩව අනුග්‍රහය දක්වන ලදී. එසේම UCSC කාර්ය මණ්ඩලය පර්යේෂණ ව්‍යාපෘති සඳහා NRC ප්‍රදාන සහ NSF ප්‍රදාන කිහිපයක් ඍක ගැනීමෙහිලා සාර්ථක විය.

දිගු කාලයක් තිස්සේ අවශ්‍යව තිබූ UCSC හි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු මෙම වසරේ දී ද අඛණ්ඩව සිදු කරන ලද අතර සම්පූර්ණ කරන ලද ප්‍රදේශ කීපයක් උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් විසින් දැනටමත් භාවිතා කරනු ලැබේ මෙය පසුගිය වර්ෂ පහ මුළුල්ලේ මුහුණදුන් උග්‍ර ඉඩකඩ ගැටලුවලට අර්ධ වශයෙන් පිළිතුරු ලබා දෙනු ඇත. කෙසේ වුවද අනාගත ව්‍යාප්ත කිරීම් සඳහා පහසුකම් සැලසීම පිණිස සිදු කළ යුතු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති කිහිපයක් ද ඇත. ආචාර්ය උපාධිධාරීන් 20 දෙනෙකු සහිත රට තුළ අතිශයින් සුදුසුකම්ලත් පරිගණක කාර්ය මණ්ඩලය රඳවා ගැනීමට දිගටම කටයුතු කරගෙන යන අතරතුර එහි මානව සම්පත් හිඟයට අර්ධ වශයෙන් හෝ පිළිතුරු සැපයීමට UCSC එහි අධ්‍යායන සංචිතය තවදුරටත් ශක්තිමත් කරන ලදී. උමියා විශ්වවිද්‍යාලය සමග ඇති කර ගත් විදේශ කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන ද අඛණ්ඩව කර ගෙන ගිය අතර එම විශ්වවිද්‍යාලය සමග ප්‍රථම වරට ශිෂ්‍යයන් හුවමාරු කිරීම ද මෙම වසරේ දී ආරම්භ කරන ලදී.

පවතින උපාධි වැඩසටහන් ජාත්‍යන්තර ප්‍රමිති සමග පෙළ ගැස්වීමට විෂයමාලා සංවර්ධන කටයුතු අවසන් කිරීම සමග වර්ෂයේදී මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ නව උපාධි වැඩසටහන් කරා යොමුවන බඳවා ගැනීම් සිදු කෙරිණි. අපේ උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය ඉහළම ඉංජිනේරු සහ වෛද්‍ය උපාධිධාරීන්ගේ මට්ටම්වලටද සමාන වේ.

උපාධි අපේක්ෂකයන් සහ පශ්චාත්-උපාධි අපේක්ෂකයන් බඳවා ගැනීම මෙන්ම පර්යේෂණ ඇතුළුව උපාධිධාරී සහ පශ්චාත්-උපාධිධාරී සංඛ්‍යාව ද ඉහළයාමක් මෙම වසර තුළ දී නිරීක්ෂණය කරන ලදී. මෙම වසරේ දී ද අපේ උපාධි වැඩසටහන් සඳහා විදේශ ශිෂ්‍යයන් UCSC විසින් බඳවා ගන්නා ලදී.

## UCSC කෙරෙහි කෙටි බැල්මක්

| | | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|
| **අධ්‍යාපනය (ඇතුළත් කරගත්/උපාධිය ලත්)** | | | | |
| අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් | මුළු | 737 | 738 | 769 |
| | ඇතුළත් වූ | 238 | - | 254 |
| | පිට වූ | 223 | 220 | 212 |
| විද්‍යා උපාධි අපේක්ෂකයන් | | 1160 | 1267 | 1275 |
| බාහිර ඩිප්ලෝමා | සියල්ල | 4287 | 4166 | 4175 |
| | ඇතුළත් වූ | 2365 | 2029 | 2034 |
| | පිට වූ | 576 | 654 | 611 |
| බාහිර උසස් ඩිප්ලෝමා | මුළු | 2019 | 2390 | 2391 |
| | ඇතුළත් වූ | 863 | 974 | 714 |
| | පිට වූ | 309 | 262 | 305 |
| බාහිර උපාධි | මුළු | 1293 | 1413 | 1416 |
| | ඇතුළත් වූ | 442 | 476 | 312 |
| | පිට වූ | 129 | 172 | 194 |
| පශ්චාත් උපාධි | මුළු | 531 | 523 | 303 |
| | ඇතුළත් වූ | 143 | 158 | 143 |
| | පිට වූ | 94 | 156 | 122 |
| ව්‍යාප්ති වැඩසටහන් | | 678 | 528 | 309 |
| **පර්යේෂණ** | | | | |
| පර්යේෂණ (දර්ශනපති/ආචාර්ය) | සියල්ල | 46/00 | 41/01 | 39/07 |
| | ඇතුළත් වූ | 13 | 10 | 09 |
| | පිට වූ | 1 | 3 | 6 |
| පර්යේෂණ ව්‍යාපෘති | මුළු | 05 | 05 | 05 |
| | නව | 1 | 2 | 1 |
| ප්‍රකාශන | | 65 | 68 | 71 |
| **උපදේශනාත්මක ව්‍යාපෘති** | | | | |
| දේශීය | | 14 | 12 | 10 |
| විදේශීය | | 01 | 01 | - |
| **සමාජ වගකීව යුතු භාවය පිළිබඳ වැඩසටහන්** | | 10 | 10 | 10 |

| | | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|
| **පාලනය** | | | | |
| ස්ථිර අධ්‍යායන කාර්ය මණ්ඩලය | මුළු | 36 | 37 | 36 |
| | මහාචාර්යවරු | 02 | 02 | 02 |
| | ආචාර්ය | 18 | 19 | 20 |
| | විශාරද | 12 | 12 | 10 |
| ස්ථිර අධ්‍යායන සහායක කාර්ය මණ්ඩලය | | 02 | 04 | 04 |
| තාවකාලික අධ්‍යායන කාර්ය මණ්ඩලය (උපදේශකයන් සහ සහකාර කථිකාචාර්යවරු) | | 11 | 12 | 15 |
| ස්ථිර පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 32 | 34 | 40 |
| කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය (අනියම් සහ අභ්‍යාසලාභී ඇතුළුව) | | 37 | 67 | 49 |
| පර්යේෂණ/ව්‍යාපෘති කාර්ය මණ්ඩලය | | 14 | 10 | 11 |
| **මූල්‍ය ය** | | | | |
| වාර්ෂික පුනරාවර්තන වියදම (ශ්‍රී ලංකා රුපියල් මිලියන) | | 92 | 111 | 133 |
| භාණ්ඩාගාර ප්‍රදාන (පුනරාවර්තන) (ශ්‍රී ලංකා රුපියල් මිලියන)- සත්‍ය | | 83 | 92 | 90 |
| භාණ්ඩාගාර ප්‍රදාන (ප්‍රාග්ධන) (ශ්‍රී ලංකා රුපියල් මිලියන)- සත්‍ය | | 16 | 19 | 26 |
| උපයන ලද අදායම | | 159 | 194 | 242 |
| UG සඳහා UCSC දායකත්වය (ශ්‍රී ලංකා රුපියල් මිලියන) (උපයන ලද %) | | 22 (14%) | 31 (16%) | 88 (37%) |
| UCSC අයවැය (ශ්‍රී ලංකා රුපියල් මිලියන) | | 205 | 246 | 286 |
| පර්යේෂණ/ව්‍යාපෘති (ශ්‍රී ලංකා රුපියල් මිලියන) | | 6.2 | 5.6 | 9.3 |
| සේවක පිරිවැය අනුපාතය (ශ්‍රී ලංකා රුපියල් '000) වර්ෂයකට | | 578 | 670 | 774 |
| ශිෂ්‍ය පිරිවැය අනුපාතය (ශ්‍රී ලංකා රුපියල් '000) – භාණ්ඩාගාර පුනරාවර්තන | | 125 | 151 | 152 |
| **යටිතල පහසුකම්** | | | | |
| පුස්තකාල පොත් | | 10,214 | 10,405 | 8,303 |
| පරිගණක : කාර්ය මණ්ඩලය | | 1:1 | | |
| පරිගණක : ශිෂ්‍යයන් (සාමාන්‍ය ශිෂ්‍යයන්)<br>(විශේෂ ශිෂ්‍යයන්) | | 1:4<br>1:1 | | |
| ඉඩ භාවිතය (සේවකයකු) (වර්ග මීටර්) | | 9.42 | 9.42 | 10.42 |
| ඉඩ භාවිතය (ශිෂ්‍යයකු) (වර්ග මීටර්) | | 1.90 | 2.32 | 2.68 |

පරිගණක විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උසස් අධ්‍යාපනය සැපයීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීමේ අරමුණ සඳහා උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස, අවසන් වරට 1995 අංක 1 දරන (සංශෝධිත) පනත මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ(1) වගන්තිය යටතේ කළ නියමයක් මගින්, කොළඹ විශ්වවිද්‍යාලයේම ආයතන දෙකක් වන පරිගණක තාක්ෂණය පිළිබඳ අධ්‍යායනායතනය (ICT) සහ පරිගණක විද්‍යා අධ්‍යායනාංශය (DCS) ඒකාබද්ධ කිරීමෙන් 2002 සැප්තැම්බර් 1 වන දින කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යායනායතනය (UCSC) පිහිටුවන ලදී. පනත ප්‍රකාරව එය උසස් අධ්‍යාපන ආයතනයකි. UCSC අඳාා පනත 2002 නොවැම්බර් 15 දින ගැසට් කරන ලද අතර (ගැසට් අංක. 1262/32) ඩිජිටල් අපරාධ විද්‍යා මධ්‍යස්ථානය ඇතුළු කිරීමට 2011 ජූලි 22 වන දින සංශෝධනය කරන ලදී (ගැසට් අංක. 1715/32).

කෙටි ඉතිහාසය

කොළඹ විශ්ව විද්‍යාලයෙහි පරිගණකකරණය පිළිබඳ ඉගැන්වීම 1967 දී සංඛ්‍යාන ඒකකය ගණිත අධ්‍යානාංශයේ වෙනම ඒකකයක් ලෙස පිහිටුවීම මගින් ප්‍රථම වරට ආරම්භ කරන ලදී . පසුව මහාචාර්ය වී.කේ. සමරනායකගේ මූලික මගපෙන්වීම සහිතව, සංඛ්‍යාන ඒකකය සංඛ්‍යාන උපදේශනය සහ දත්ත පිරිසැකසුම් සේවා මධ්‍යස්ථානයක් ලෙස ඉහළ නංවන ලදී. මෙය බොහෝ අනාගත සංවර්ධනයන්ට මං සලසා තිබුණි. 1985 වන විට, මෙම මධ්‍යස්ථානය සංඛ්‍යානය සහ පරිගණක විද්‍යා අධ්‍යායනාංශය (DSCS) දක්වා වර්ධනය වී තිබුණි. මෙම අධ්‍යානාංශයේ ප්‍රධාන කාර්යය වූයේ සංඛ්‍යානය සහ පරිගණක විද්‍යාව පිළිබඳ විශේෂ උපාධි පැවැත්වීමයි. ඇතුළත් කර ගැනීමකට හුදෙක් ශිෂ්‍යයන් 40 දෙනෙකු බිහි කරමින් DSCS පරිගණක විද්‍යා විශේෂීකරණ වැඩසටහන පිරිනැමූ අතර, එය පරිගණක විද්‍යා ක්ෂේත්‍රයෙහි (CS) වැඩිවන ඉල්ලුමට කිසිසේත් ප්‍රමාණවත් නැත.

1997 දී, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ශිෂ්‍යයන් 50 ක කාණ්ඩයක් සෘජුවම පරිගණක විද්‍යා අධ්‍යායනය සඳහා බඳවා ගත් නමුත්, මේ වන විට, බොහෝ දෙනෙකු පරිගණක විද්‍යා ක්ෂේත්‍රයෙහි (CS) වැඩි වන ඉල්ලුමට සරිලන අයුරින් DSCS හි පරිගණක විද්‍යා උපඅංශය වෙනම අධ්‍යානාංශයක් ලෙස පුළුල් කිරීමට අවශ්‍ය බව අවබෝධ කරගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2001 දී, DSCS නම් වශයෙන් පරිගණක විද්‍යා අධ්‍යායනාංශය සහ සංඛ්‍යාන අධ්‍යානාංශය ලෙස අධ්‍යායනාංශ දෙකකට වෙන් කරන ලදී.

පරිගණක විද්‍යා අධ්‍යායනාංශය පීඨයක සීමාකාරී රාමුව තුළ ක්‍රියාත්මක වීමේ ස්වකීය සීමා හඳුනාගත් අතර ඒ සමගම එය අනාගත වර්ධන හව්‍යතා උකහා ගැනීම සඳහා ශක්තිමත් කර්මාන්ත සබඳතාවයක් තිබීමේ වැදගත්කම අවබෝධ කර ගත්තේය. විශ්වවිද්‍යාලය කර්මාන්ත අභිමුඛ පරිගණක තාක්ෂණ ආයතනය (ICT) සහ න්‍යායිකව වඩාත් නැඹුරු වූ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යා අධ්‍යායනාංශය අතර උපායමාර්ගික ඒකාබද්ධයක වැදගත්කම අවබෝධ කර ගන්නා ලදී.

ICT හට කර්මාන්ත සමග ශක්තිමත් සබඳතාවයක්ද ඒ සමගම විදේශීය ආධාර නියෝජිතායතන සමග උසස් ආයතනික පැතිකඩක්ද පැවතිණි. එසේම ICT ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA), ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය (Sida) සහ වෙනත් ආධාර ලබාදෙන්නන් කිහිප දෙනෙක් වෙතින් විශාල සම්පත් ප්‍රමාණයක් ලබා ගැනීම පහසු කරමින් ඔවුන්ගේ ව්‍යාපාර මෙහෙයුම්වලදී වැඩි ස්වාධිපත්‍යයක් භුක්ති විඳින ලදී.

මෙම ඒකාබද්ධය 2002 සැප්තැම්බර් 01 වන දින කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යායනායතනයට (UCSC) උත්පත්තිය ලබා දුන්නේය. මහාචාර්ය. වී.කේ. සමරනායක ඔහුගේ ප්‍රගාමී චින්තනයෙන් UCSC හි අනුයාත ප්‍රයත්න කිහිපයකින් සාර්ථකත්වය අත්කර ගැනීමට මාර්ගය පාදා දුන් අතර, ඔහු UCSC හි සමාරම්භක අධ්‍යක්ෂක බවට පත් විය. මේ සියල්ල හරහා, UCSC හට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ICT පිළිබඳ විශිෂ්ටතම මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපනය වීමට හැකි විය.

## UCSC හි සංවිධානය

අධ්‍යයනාංශ තුන සහ මධ්‍යස්ථාන හය ප්‍රවර්තන වර්ෂය සඳහා ද ඔවුන්ගේ ක්‍රියාකාරී වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම දිගටම කරගෙන යන ලදී.

## UCSC හි අධ්‍යයනාංශ

උපාධි අපේක්ෂක අධ්‍යයන වැඩසටහන සඳහා, රාජ්‍ය අරමුදල් UGC හරහා සෘජුවම UCSC වෙත ලැබේ. ලද මුදල් වර්ෂය සඳහා සැලසුම්ගත ක්‍රියාකාරකම් කරගෙන යාමට ප්‍රමාණවත් නොවූ අතර එබැවින් ඇතැම් උපයාගත් අදායම් උපාධි අපේක්ෂක අධ්‍යයන ක්‍රියාකාරකම් සඳහා භාවිත කරන ලදී. UCSC හට අධ්‍යයනාංශ තුනක් ඇති අතර අධ්‍යයන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ විශේෂීකරණය සහ ඉගැන්වීමේ විශේෂඥතාවය පදනම් කොටගෙන මෙම අධ්‍යයනාංශ සඳහා වෙන් කර ඇත. පිළිවෙළින් උපාධි අපේක්ෂක, පශ්චාත් උපාධි සහ බාහිර සහ ව්‍යාප්ති වැඩසටහන් ඒවායෙහිම ස්ව  වැඩසටහන් පිරිනමනු නොලබන බැවින් ඒ පිළිබඳව බැලීමට අධ්‍යයනාංශ ප්‍රධානීන් තුන් දෙනෙකු පත් කරන ලදී. අධ්‍යයනාංශ තුන වන්නේ,

1. පරිගණක සහ බුද්ධිමත් පද්ධති (CIS);
2. සන්නිවේදන සහ මාධ්‍ය තාක්ෂණ (CMT);
3. තොරතුරු පද්ධති ඉංජිනේරු (ISE).

## UCSC හි මධ්‍යස්ථාන

UCSC බොහෝ ද්විතියික ක්‍රියාකාරකම් ද සිදු කරයි. මෙම ක්‍රියාකාරකම් වෙන්වූ මධ්‍යස්ථාන හයක් යටතේ සංවිධානය කෙරේ. එක් එක් මධ්‍යස්ථානය සඳහා මධ්‍යස්ථානයේ එදිනෙදා රාජකාරි කටයුතු කළමනාකරණය කරන සම්බන්ධීකාරකයකු සිටී. මධ්‍යස්ථාන හය පහත පරිදි ය:

1. උසස් ඩිජිටල් බහුමාධ්‍ය මධ්‍යස්ථානය (ADMTC);
2. පරිගණක සේවා මධ්‍යස්ථානය (CSC);
3. බාහිර උපාධි මධ්‍යස්ථානය (EDC);
4. ඊ-ඉගෙනුම් මධ්‍යස්ථානය (e LC);
5. වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (PDC);
6. ඩිජිටල් අපරාධ සඳහා මධ්‍යස්ථානය (CDF).

## පාලනය

---

සංයුක්ත සැලැස්මහි දක්වා ඇති පරිදි, UCSC ක්‍රියාකරකම්වල මුඛ්‍ය ක්ෂේත්‍ර වන්නේ *අධ්‍යාපනය, පර්යේෂණ, උපදේශනය සහ සමාජ වගකිව යුතු භාවයයි.* මේවායින්, UCSC ආයතනය ඉතිරි ICT අධ්‍යාපන අංශය වෙතින් වෙන්කොට තබන සහ, අනෙක් අධාරක තුනට දායක වන මධ්‍යම අධාරකය ලෙස පර්යේෂණ හඳුනාගෙන තිබේ. මෙම අධාරකවලට ප්‍රධාන මූලාශ්‍ර දෙකකින් සහාය ලැබේ; මානව සහ භෞතික යටිතල පහසුකම්/සම්පත් සහ පරිපාලන/මූල්‍ය  සේවා. ඊට අමතරව, මෙම සියලු පැති යහ පාලනයේ ‘පියසක්’ මගින් ප්‍රශස්ත සඵලත්වය සඳහා එක්ව තබා ගැනීම සහ මෙහෙයවීම සිදු කරයි.

### කළමනාකරණය

UCSC හි කළමනාකරණය අංශාධිපතිවරුන්ගේ සහ මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරුන්ගේ සහයෝගය ඇතිව UCSC හි නිලධාරීන් විසින් මෙහෙයවයි. UCSC හි සියලු ව්‍යවස්ථාපිත සහ තේරීම් කමිටුවල මුලසුන අධ්‍යක්ෂක විසින් හොබවයි.

## UCSC හි නිලධාරීන්

**අධ්‍යක්ෂක:** මහාචාර්ය ජී.එන්. වික්‍රමනායක; **නියෝජ්‍ය අධ්‍යක්ෂක:** මහාචාර්ය එන්.ඩී. කොඩිකාර;

## UCSC හි අධ්‍යයනාංශ ප්‍රධානීන්

**CIS:** ජී.පී. සෙනෙවිරත්න මහතා; **CMT:** ජී.කේ.ඒ. ඩයස් මහතා; **ISE:** ආචාර්ය ඩී.ඩී. කරුණාරත්න;

## UCSC හි මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරු

**ADMTC:** එස්.ටී. නන්දසාර මහතා; **CSC:** එල්.පී. ජයසිංහ මහතා; **EDC:** එස්.පී. ආරියරත්න මහත්මිය; **eLC:** ආචාර්ය කේ.පී. හේවාගමගේ; **PDC:** ආචාර්ය එස්.එම්.කේ.ඩී. අරුණතිලක; **CDF:** කේ.එස්. ගුණතිලක මහතා.

***අධිකාරීන්***

අධ්‍යායනායතනයේ අධිකාරීන් වන්නේ කළමනාකරණ මණ්ඩලය; අධ්‍යායන සම්මේලය; අධ්‍යායන මණ්ඩල; අධ්‍යායන අධ්‍යායනාංශ සහ මධ්‍යස්ථාන.

**කළමනාකරණ මණ්ඩලය**

වර්ෂය තුළදී කළමනාකරණ මණ්ඩලයේ මාසික රැස්වීම් 12 ක් සහ විශේෂ රැස්වීම් 03 පවත්වන ලදී. කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය පහත දක්වා ඇත.

අධ්‍යාක්ෂ (සභාපති); නියෝජ්‍ය අධ්‍යාක්ෂ; අධ්‍යායනාංශ ප්‍රධානී (CIS/CMT/ISE); **නම් කළ/ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය:** පියසේන රනේපුර මහතා; **නම් කළ/මුදල් අමාත්‍යාංශය:** ආර්. උඩුවාවල මහතා (මැයි දක්වා) සහ පී.ඒ. ඩයස් මහතා (ජූනි සිට);**පීඨාධිපති, විද්‍යා පීඨය:** මහාචාර්ය ටී.ආර්. ආරියරත්න සහ මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම (වැඩ බලන පෙබ-මැයි); **කවුන්සිලය නම් කළ, UOC:** සී. මාලියද්ද මහතා සහ එච්.එම්.එන්. වරකවුල්ල මහතා; **සනාතන සභාව නම් කළ, UOC:** මහාචාර්ය කේ.එච්. තෙන්නකෝන් සහ මහාචාර්ය. පී.එස්.එම්. ගුණරත්න මහතා; **UGC නම් කළ:** එස්. මුදලිගේ මහතා සහ දේශමාන්‍ය එම්.ඩී.ඩී. පීරිස් මහතා; **IT කර්මාන්තයේ නියෝජිතයන්:** මනෝ සේකරම් මහතා සහ ඩී.බී. සපරමාදු මහතා; **අධ්‍යායන සංසදය නම් කළ, UCSC:** ආචාර්ය ඩී.එන්. රණසිංහ, ආචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න, ආචාර්ය එම්.සී. ජයවර්ධන (ජූලි දක්වා), ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරළ (සැප්. සිට); හිටපු අධ්‍යාක්ෂක (ආරාධනා කළ): ආචාර්ය ඒ.ආර්. වීරසිංහ.

කළමනාකරණ මණ්ඩලයට මූල්‍ය සහ කළමනාකරණ කමිටුව සහ විගණන කමිටුව යන උප කමිටු දෙක සහාය විය. වර්ෂය තුළ කමිටු දෙක පිළිවෙලින් රැස්වීම් 03ක් සහ 04ක් පවත්වන ලදී. කමිටු දෙකේ සංයුතිය පහත දැක්වේ.

**මූල්‍ය සහ කළමනාකරණ කමිටුව**

අධ්‍යාක්ෂක (සභාපති); නියෝජ්‍ය අධ්‍යාක්ෂක; පියසේන රනේපුර මහතා; ආර්. උඩුවාවල මහතා (මැයි දක්වා) සහ පී.ඒ. ඩයස් මහතා (ජූනි සිට); මහාචාර්ය ටී.ආර්. ආරියරත්න; දේශමාන්‍ය එම්.ඩී.ඩී. පීරිස් මහතා.

**විගණන කමිටුව**

සුජීව මුදලිගේ මහතා (සභාපති මූල්‍ය විශේෂඥ); නියෝජ්‍ය අධ්‍යාක්ෂක; සී. මාලියද්ද මහතා;පියසේන රනේපුර මහතා;ආර්. උඩුවාවල මහතා (මැයි දක්වා), පී.ඒ. ඩයස් මහතා (ජූනි සිට) එස්. සුනන්දා මෙය (විගණකාධිපතිගේ නියෝජිත), අභ්‍යන්තර විගණකවරු (E&Y).

**අධ්‍යායන සම්මේලය**

වර්ෂය තුළදී අධ්‍යායන සම්මේලයේ රැස්වීම් 09ක් පවත්වන ලදී. අධ්‍යායන සම්මේලයේ සංයුතිය පහත දැක් වේ.

අධ්‍යාක්ෂක; නියෝජ්‍ය අධ්‍යාක්ෂක; අධ්‍යායනාංශ ප්‍රධානීන් (CIS/ CMT/**ISE**); **මධ්‍යස්ථාන** සම්බන්ධීකාරකවරුන් (ADMTC/CSC/ EDC/eLC/PDC); **නම් කළ (විද්‍යා පීඨය): මහාචාර්ය ආර්.ඩී. විජේසේකර;** නියෝජිතයන්/IT කර්මාන්තය: ආචාර්ය ආර්.ඒ.සී. රණසිංහ; ජ්‍යෙෂ්ඨ විද්‍යාර්ථීන් (UCSC); ඉගැන්වීම් කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකි: එම්.පී.එම්.කේ. සිල්වා මහතා; ඩබ්.එම්.ආර්. වීරසූරිය මහතා (මැයි දක්වා); ආචාර්ය. එච්. යූසුෆ්.

**අධ්‍යයන මණ්ඩල**

අධ්‍යයන මණ්ඩල තුනක් ඇත. නම් වශයෙන් IUD, RHD සහ EEP ය. ඔවුන් අභ්‍යන්තර උපාධි අපේක්ෂක උපාධි (IUD), පර්යේෂණ සහ උසස් උපාධි (RHD) සහ අභ්‍යයන්තර සහ ව්‍යාප්ති වැඩසටහන් (EEP) වෙත යොමුවී ඇත. මණ්ඩල තුන වර්ෂය තුළ පිළිවෙළින් රැස්වීම් 10, 11 සහ 11 ක් පැවැත්වීය.

## අධ්‍යාපනය

### වැඩසටහන් සහ ශිෂ්‍යයන්

UCSC විවිධ මට්ටම්වලදී පුළුල් පරාසයක වැඩසටහන් පිරිනමයි. 1 වන වගුව අදාළ ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩල සමගින් UCSC විසින් පවත්වන පාඨමාලා (වැඩසටහන්) හඳුන්වා දෙයි.

1 වන වගුව: පිරිනමන පාඨමාලා වර්ග

| පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි වැඩසටහන් | 1,072 | 48 | 62 |
| පර්යේෂණ සහ වෙනත් ව්‍යාපෘති | 53 | 13 | 10 |
| ව්‍යාප්ති පාඨමාලා | 309 | 22 | 28 |
| බාහිර උපාධි | 5,778 | 55 | 34 |
| මාර්ගගත | 13,814 | 15 | 15 |
| වෙනත් – විද්‍යා පීඨය | 1,275 | 20 | 2 |

### උපාධි අපේක්ෂක අධ්‍යාපනය

උපාධි අපේක්ෂකයින් සඳහා පරිගණක අධ්‍යාපනය විද්‍යා පීඨයේ කොටසක් වශයෙන් 1967 දී මුලින්ම හඳුන්වා දෙන ලදී. UCSC විසින් මෙම අවස්ථාව විද්‍යා පීඨයේ සිසුන් 1,275කට ලබාදීම අඛණ්ඩව කරගෙන යන ලදී. පරිගණක විද්‍යාව උපාධියක් වශයෙන් ලබාදීම 1990 දී ආරම්භ කරන ලදී. සියල්ල එක්ව, උපාධි අපේක්ෂකයන් 2,044ක් UCSC හි පුහුණුව ලබමින් සිටී. දැනට UCSC විසින් සිසුන් 494කට පරිගණක විද්‍යා (CS) උපාධිය ද සිසුන් 275කට තොරතුරු පද්ධති (IS/ICT) උපාධියද පිරිනමයි.

**අභ්‍යන්තර උපාධි**

යෝජිත උපාධි වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීම විශ්ව විද්‍යාල කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අතර 2012/2013 අධ්‍යයන වර්ෂයේ සිට එය ක්‍රියාත්මක වීම ආරම්භ විය.

පහත දැක්වෙන උපාධි පිරිනැමීම සඳහා පරිගණක විද්‍යා උපාධිය ප්‍රතිව්‍යුහගත කරන ලදී. අපේක්ෂිත උපාධිධාරී ගුණාංග අත්කර ගැනීම සඳහා සහ ලෝකය පුරා IT, IS සහ පරිගණක විද්‍යා වෘත්තිකයින්ගේ ඉහළ ඉල්ලුමට අමතරව IEEE/ACM විෂයමාලා නිර්දේශවලට අනුකූල වන පරිදි යෝජිත විෂයමාලාව සකස් කරන ලදී.

(i) පරිගණක විද්‍යාව පිළිබඳව, වසර තුනක විද්‍යාවේදී උපාධිය (පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී);

(ii) පරිගණක විද්‍යාව පිළිබඳව, වසර හතරක විද්‍යාවේදී ගෞරව උපාධිය (පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව)

(ii) පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳව, වසර හතරක විද්‍යාවේදී ගෞරව උපාධිය (පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව)

ව්‍යාපාර අවශ්‍යතා සහ තාක්ෂණික විසඳුම් අතර ඇති හිඩැස පුරවනු පිණිස නව ආකාරයක තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් බිහි කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපාධි වැඩසටහන (BICT) ප්‍රතිව්‍යුහගත කර ඇත. IS උපාධි වැඩසටහන මෙම නව ICT වෘත්තිකයන් බිහි කිරීමට නිර්මාණය කර ඇත. මෙම වැඩසටහනේ විෂය නිර්දේශය සන්නිවේදනය හා කණ්ඩායම් ක්‍රියා වැනි මෘදු කුසලතාවල ඇති වැදගත්කමද හුවා දක්වයි.

මෙම වැඩසටහන යටතේ පිරිනමන උපාධි පහත දැක්වෙන පරිදි වේ:-

(i) තොරතුරු පද්ධති පිළිබඳව වසර තුනක විද්‍යාවේදී උපාධිය (තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී)
(ii) තොරතුරු පද්ධති පිළිබඳව, වසර හතරක විද්‍යාවේදී ගෞරව උපාධිය (තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී ගෞරව)

උපාධි වැඩසටහන පවතින වසර තුනේ සහ 3+1 (වසර 4) උපාධි වෙනුවට 2+1 (වසර 3) සහ 2+2 (වසර 4) උපාධි පිරිනැමීමට ප්‍රතිනිර්මාණය කරන ලදී. නව CS විෂය ධාරා වැඩසටහනේ පවතින CS වසර 3 සහ 4 ට අමතරව වසර 4 ක මෘදුකාංග ඉංජිනේරුකරණ (SE) විෂය ධාරාව දැන් අන්තර්ගතය. ඉහත වෙනස් කිරීම් හේතුවෙන් UCSC හට 2013 වසරේදී සාමාන්‍යයෙන් පවත්වන අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන් හතර වෙනුවට හයක් පැවැත්වීමට සිදු විය.

2013 වසරේ පැවැත් වූ පරිගණක විද්‍යා විෂය ධාරාවේ උපාධි වැඩසටහන් යටතේ, 1වන වසර සිසුන් සඳහා පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියද (පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී)2වන සහ 3වන වසර සිසුන් සඳහා පරිගණක විද්‍යාවේදී (BCS) උපාධියද පවත්වන ලදී. 4වන වසර සිසුන් සඳහා පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියද (පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී) පවත්වන ලදී. CS උපාධිය සඳහා උ/පෙ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් සිසුන් තෝරා ගන්නා අතර ICT උපාධිය ඕනෑම විෂය ධාරාවකට විවෘතය.

තොරතුරු පද්ධති විෂය ධාරාව යටතේ, 1වන වසර සිසුන් සඳහා තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධියද (තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී), 2වන සහ 3වන වසර සිසුන් සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී (BICT) උපාධියද පවත්වන ලදී. 4වන වසර සිසුන් සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී) පවත්වන ලදී. මෙම වැඩසටහනේ විෂය නිර්දේශය සන්නිවේදනය හා කණ්ඩායම් ක්‍රියා වැනි මෘදු කුසලතාවල ඇති වැදගත්කමද හුවා දක්වයි. වැඩසටහන උ/පෙ ඕනෑම විෂය ධාරාවකට විවෘත අතර එබැවින් සිසුන් සුදුසුකම් ලැබීමට අභියෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

**ඇතුළත් කර ගැනීම**

2012/2013 ශිෂ්‍ය කණ්ඩායම යටතේ, UCSC විසින් පරිගණක විද්‍යා උපාධිය සඳහා ශිෂ්‍යයන් 153 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් බඳවා ගත් අතර 2012/2013 අධ්‍යයන වර්ෂය සඳහා තොරතුරු පද්ධති උපාධිය සඳහා ශිෂ්‍යයින් 101 දෙනෙක් බඳවා ගන්නා ලදී. 2013 වර්ෂයේ දී, UCSC හි ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 769ක් විය. පුනරාවර්තන වියදම්වල බෙදා දැක්වීම 2වන වගුවෙහි දී ඇත. තොරතුරු තාක්ෂණ කර්මාන්තය තුළ පිළිගත් ව්‍යාපාර ආයතන වාසි සහගත ගිවිසුම් මත තුන්වන වසර උපාධි පාඨමාලාව හදාරන බොහෝ සිසුන්ව, ඔවුන්ගේ කාර්මික ස්ථානගත කිරීම අවසන් වීමටත් පෙර බඳවා ගැනීම නිරීක්ෂණය කරන ලදී. නැවත විභාග කළ අට දෙනෙක්ද මෙම කණ්ඩායම සමග උපාධි ලැබිය.

2 වගුව: අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන්

| පාඨමාලාව | ඇතුළත් කර ගැනීම 2012 | 1 වන වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | එකතුව | උපාධි ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| පරිගණක විද්‍යා විද්‍යාවේදී උපාධිය | 153 | 153 | - | - | - | 153 | - |
| පරිගණක විද්‍යාවේදී උපාධිය | - | - | 155 | 146 | - | 301 | 97 |
| පරිගණක විද්‍යා විද්‍යාවේදී උපාධිය | 40 | - | - | - | 40 | 40 | 39 |
| තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 101 | 101 | - | - | - | 101 | - |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය | - | - | 78 | 76 | - | 154 | 56 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 20 | - | - | - | 20 | 20 | 20 |
| **UCSC හි උපාධි අපේක්ෂකයන්** | **314** | **254** | **233** | **222** | **60** | **769** | **212** |
| විද්‍යාවේදී විද්‍යා පීඨය | - | 520 | 430 | 285 | 40 | 1275 | - |
| **අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන්** | **316** | **774** | **663** | **507** | **100** | **2044** | **212** |

සියලු පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි

**බාහිර කාර්ය මණ්ඩලය**

අභ්‍යන්තර උපාධි අපේක්ෂක පාඨමාලා ප්‍රදානයේ දී මුළු අධ්‍යායන සහ අධ්‍යායන සහායක කාර්ය මණ්ඩලය සහභාගි විය. ICT උපාධි පාඨමාලාවේ බාහිර සහාය අවශ්‍ය පාඨමාලා බොහොමයක් අඩංගුය. ICT උපාධි වැඩසටහනේ පාඨමාලා 10ක් පැවැත්වීමට බාහිර කථිකාචාර්යවරුන් ලෙස පුද්ගලයින් 12 දෙනෙකුට ආරාධනා කරන ලදී.

**කාර්මික පත් කිරීම**

වෘත්තීය සංවර්ධන ආයතනය (PDC), තොරතුරු තාක්ෂණ කර්මාන්තය සමග සමීප සම්බන්ධතාව සහ උපාධි අපේක්ෂකයන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අධ්‍යායන වැඩසටහන්වල උන්නතිය කාර්මික සම්බන්ධය තුළින් අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. PDC, වර්ෂය තුළදී ඔවුන්ගේ මාස 6 පුහුණුව සඳහා උපාධි අපේක්ෂකයින් 218 දෙනෙකු සංවිධාන 76කට පත් කරන ලදී. මෙයට Linnaeus-Palme ශිෂ්‍ය හුවමාරු වැඩසටහන යටතේ උමියා විශ්වවිද්‍යාලයට පත් කළ UCSC සිසුන් දෙදෙනෙක් ඇතුළත් විය. උමියා විශ්වවිද්‍යාලයේ සිසුන් දෙදෙනෙක් ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයට පත් කරන ලදී. උපාධිධාරියෙක් වූ පසු ක්‍රියා කිරීමට සිදු වන වෘත්තීය භූමිකාව පිළිබඳ උපාධි අපේක්ෂකයින් දැනුවත් කිරීම සඳහා, ආරාධිත දේශන මාලාවක් PDC විසින් සමාගම්වලට ස්වේච්ඡාවෙන් සහභාගි වීම සඳහා සංවිධානය කරන ලදී. එම සිසුන් දෙදෙනාට ණය ප්‍රදානය කෙරිණි. මෙම දේශන හරහා, උපාධි අපේක්ෂකයින්ට මනා සමාරම්භක වැඩසටහනක් සහ ආධුනික පත්වීම සඳහා යාමට පෙර සූදානමක් සපයන ලදී. ආධුනික පත්වීමේ කාලය තුළ ලබා ගත යුතු අරමුණු හා කුසලතා පිළිබඳව ඔවුන්ට මනාව සන්නිවේදනය කෙරිණි.

කාර්මික පුහුණුවට අමතරව, PDC විසින් 4 වන වසර උපාධි අපේක්ෂකයින්ට, ඔවුන්ගේ "වෘත්තියට පා නැගීමට" කර්මාන්තයේදී අත්‍යවශ්‍ය මෘදු කුසලතා වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව මෘදු කුසලතා සංවර්ධන වැඩසටහනක් සංවිධානය කරන ලදී. ඉදිරිපත් කිරීමේ නිපුණතා, සන්නිවේදන නිපුණතා, කණ්ඩායම් ගොඩනැගීම, කාල කළමනාකරණය, ආතතිය කළමනාකරණය, පුද්ගලික ඵලදායීතාව, ගැටුම් නිරාකරණය, ප්‍රශ්න විසඳීම, ආයතනික සංස්කෘතිය, නායකත්ව නිපුණතා සහ ව්‍යවසායකත්ව නිපුණතා මෙහි දී සැලකිල්ල යොමු කළ ක්ෂේත්‍ර අතර විය. ශිෂ්‍යයන් සඳහා වෘත්තීය වෙළඳපොළක්, කර්මාන්ත සංචාර, සම්මන්ත්‍රණ සහ පරිසංවාද සන්නිවේදන සංවිධානය කිරීම අනෙක් ක්‍රියාකාරකම් අතර වේ. 2013 දෙසැම්බර් සහ 2014 ජනවාරි මස සිසුන් සිය අවසන් පරීක්ෂණවලට පෙනී සිටීමට පෙර ඔවුන්ට රැකියා අවස්ථා උදා කර ගැනීම සඳහා ඔක්තෝබර් 31වන දින වෘත්තීය වෙළඳපොළ පවත්වන ලදී.

**ශිෂ්‍ය සුභසාධනය**

ඕස්ට්‍රේලියාවේ සිටින දානපතියෙක් විසින් ජූනි 26 වන දින 1 වන වසරේ අවශ්‍යතාව සහිත ශිෂ්‍යයෙක් සඳහා ලැප්ටොප් පරිගණකයක් පරිත්‍යාග කරන ලදී.

**නේවාසිකාගාරය**

2013 වසරේ දී, UCSC විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය අනුව යමින් 1වන වසරේ සිටින වැඩිම අවශ්‍යතාව සහිත උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් සඳහා නේවාසික පහසුකම් සපයන ලදී. මෙම කාර්යය සඳහා පහත දැක්වෙන නේවාසිකාගාර කුලියට සහ බද්දට ගන්නා ලදී. පළමු වසරේ ශිෂ්‍යයන් සඳහා වූ කිරුළපන පිහිටි පිරිමි නේවාසිකාගාරය සහ පළමු වසරේ ශිෂ්‍යාවන් සඳහා වූ කොහුවල පිහිටි කාන්තා නේවාසිකාගාරය පිළිවෙළින් ශිෂ්‍යයන් 40කට සහ ශිෂ්‍යාවන් 30කට නේවාසික පහසුකම් සපයයි.

### ආපනශාලාව

විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ක්‍රියාත්මකව ඇති ආපනශාලා කීපයට අමතරව, සමාලෝචිත වර්ෂය තුළ දී, UCSC විසින් විශේෂයෙන්ම එහි ශිෂ්‍යයන් සඳහා වෙනම ශිෂ්‍ය ආපනශාලාවක් පවත්වා ගෙන යන ලදී. එමෙන්ම නව ආපනශාලාවක් ඉදිකිරීමේ වැඩකටයුතු ද මෙම වර්ෂය තුළ දී ආරම්භ කරන ලදී.

### උපදේශනය

සියලු ශිෂ්‍යයන් සඳහා ශිෂ්‍ය උපදේශකයින් හතර දෙනෙකුගේ (කථිකාචාර්යවරු දෙදෙනෙක් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු දෙදෙනෙක්) සේවය ලබා දෙන ලදී. තවද, උපදේශනය අවශ්‍ය වූ ශිෂ්‍යයන් සඳහා පහසුකම් සැලසීම පිණිස සතියකට පැය 3ක කාලපරිච්ඡේදයක් සඳහා වෘත්තීය උපදේශකයෙකුගේ සේවාව ද ලබා ගන්නා ලදී.

## උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් සඳහා මූල්‍ය ආධාර

මහපොළ ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර, කර්මාන්ත ශිෂ්‍යත්ව සහ පුද්ගලික ශිෂ්‍යත්ව යන ආකාරයෙන් ශිෂ්‍යයන් සඳහා මූල්‍ය ආධාර ලබා දෙන ලදී.

### මහපොළ ශිෂ්‍යත්ව

වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශයේ මහපොළ භාරකාර අරමුදලෙන් අනුග්‍රහය සලසනු ලබන මහපොළ ශිෂ්‍යත්ව ශිෂ්‍යයන් 320ක් හට පිරිනමන ලදී. කුසලතා සහ සාමාන්‍ය ශිෂ්‍යත්වවල වටිනාකම පිළිවෙලින් රු. 2,550/-ක් සහ රු. 2,500/-ක් විය.

### ශිෂ්‍යාධාර

ශිෂ්‍යාධාර සඳහා ශිෂ්‍යයන් තෝරා ගැනීම පාලනය කරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛයට අනුව ශිෂ්‍යාධාර පිරිනමන ලදී. 2013 වර්ෂය සඳහා ශිෂ්‍යාධාර ලැබූ ශිෂ්‍යයන්ගේ සංයුතිය පහත දැක්වෙන වගුවේ දැක්වේ. පූර්ණ ශිෂ්‍යාධාර සහ අර්ධ-ශිෂ්‍යාධාරවල වටිනාකම පිළිවෙළින් රු. 2,000/-ක් සහ රු. 1,900/-ක් විය.

මහපොළ සහ ශිෂ්‍යාධාර හිමි වූ ශිෂ්‍යයන් සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත වගුවේ දැක් වේ.

| ඇතුළත් කර ගැනීමේ වර්ෂය | අධ්‍යයන වර්ෂය | මහපොල ශිෂ්‍යත්ව පිරිනැමීම් | ශිෂ්‍යාධාර ලාභීන් |
|---|---|---|---|
| 2012 | 1 වන වසර සිසුන් | 116 (45%) | 30 (12%) |
| 2011 | 2 වන වසර සිසුන් | 109 (47%) | 26 (11%) |
| 2010 | 3 වන වසර සිසුන් | 85 (38%) | 26 (12%) |
| 2009 | 4 වන වසර සිසුන් | 20 (33%) | 04 (07%) |

### කර්මාන්ත ශිෂ්‍යත්ව

නම් වශයෙන් මිලේනියම් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස් සමාගම (MIT); නවන්තිස් අයිටී (පුද්ගලික) සමාගම, අයිඑෆ්එස් ආර් ඇන්ඩ් ඩී සමාගම (IFS); සහ MIND යන බාහිර ආයතන හතර අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට අනුග්‍රාහකත්වය ලබා දුනි.

### Shorea Robusta ශිෂ්‍යත්වය

කලින් පැවති පරිගණක විද්‍යා විශේෂ උපාධි වැඩසටහනේ උපාධිධාරී සංගමය විසින් 4වැනි වසරේ උපාධි අපේක්ෂක

ශිෂ්‍යයන් සඳහා වූ "Shorea Rubusta" ශිෂ්‍යත්වය නම් විශේෂ ශිෂ්‍යත්වයක් 2007 වසරේ දී හඳුන්වා දෙන ලදී. 2013 වසරේ දී මෙම යෝජනාක්‍රමය යටතේ ශිෂ්‍යත්ව දෙකක් ප්‍රදානය කරන ලද අතර ශිෂ්‍යත්වයේ වටිනාකම මාස 10ක අධ්‍යයන වර්ෂයක් සඳහා එක් මසකට රු. 2,500/-කි. මේ සඳහා තෝරා ගැනීම අධ්‍යයන කාර්යසාධනය සහ ශිෂ්‍යයන්ගේ මූල්‍ය අවශ්‍යතා මත පදනම් වේ.

## UCSC ශිෂ්‍ය සංගමය

2002 අංක 1 දරන කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතන පනතේ 25 සහ 26 යන උප-පරිච්ඡේද අනුව 2012/13 වර්ෂය සඳහා ශිෂ්‍ය සංගම් නිලවරණය පවත්වන ලද අතර එහි නිලධාරීන් නිතරඟයෙන් පත් විය. සභාපති: බී.ඩී.එච්.කේ. ජයමාන්න මහතා; උප සභාපති: ඩී.වී.බී.සී. ජයසිංහ මහතා; ලේකම්: එස්.ආර්. මුතුතන්ත්‍රිගේ මහතා; සංස්කාරක: ජේ.පී.ඩී.එස්. ජයසිංහ මහතා; කණිෂ්ඨ භාණ්ඩාගාරික: වී.ඒ. ඉසුරු මහතා; කමිටු සාමාජික: එස්.කේ. වල්පිට මහතා; එම්. සතීස් මහතා; එම්.එච්. හම්සා මහතා; බී.සී. සේනාරත්න මහතා; ඊ.එන්. ජයසූරිය මහතා; එම්.එම්.එම්. ෂිෆාන් මහතා; එම්.ජී.එන්.ඒ.එස්. ප්‍රනාන්දු මහතා ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ලෙස තවදුරටත් ධුරයේ කටයුතු කළේය.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම්

ප්‍රධාන වශයෙන් සංස්කෘතික, චාරිත්‍රමය සහ විනෝද ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමට ශිෂ්‍ය සංගමය ඔස්සේ ශිෂ්‍ය ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි. නවක ශිෂ්‍යයින් පිළිගැනීමේ උත්සවය (නොවැම්බර් මස 3වැනි දින); පිරිත් සජ්ඣායනාව (ජනවාරි මස 27වැනි දින); ක්‍රීඩා උත්සවය; පෑදුරු සාජ්ජය (මැයි 31වැනි දින); ලේ දන් දීමේ ව්‍යාපාරය; කැරකෙන කූඩුව සහිත වෙසක් සැරසිලි; සමුගැනීමේ උත්සවය; නත්තල් ගවඹරුව සහ කැරොල්; පොසොන් දන්සැල සහ පොසොන් භක්ති ගීත උළෙළ; වානි විලා උත්සවය; කණ්ඩායම් චාරිකාව ආදිය මෙම ක්‍රියාකාරකම්වලට ඇතුළත් වේ. UCSC ශිෂ්‍යයන් නොයෙක් වැඩමුළු UCSC තුළ සහ අ.පො.ස. (සා/පෙ) සහ අ.පො.ස. (අ/පෙ) ICT ශිෂ්‍යයන් හා ගුරුවරුන්ට සහාය වීමට පාසල් තුළ පවත්වයි.

### ශිෂ්‍ය ජයග්‍රහණ

ශිෂ්‍යයන් විසින් තෘතීයික (ව්‍යාපාර) සඳහා **National Best Quality ICT Awards** (NBQSA) **රන් සම්මානය** දිනා ගත්හ: ආර් රාජපක්ෂ, ඒකේ මඩුගල්ල, පීඅයියු අමරසිංහ හා වීඑච් පද්මතිලක, "FaceID: ශ්‍රී ලංකාවේ අධිකරණ වෛද්‍ය මුහුණු ප්‍රතිසංස්කරණය සඳහා මුහුණු මාංශපේශී ව්‍යුහවිද්‍යාව පාදක විසඳුමක්"; තෘතීයික (තාක්ෂණය) සඳහා NBQSA **ලෝකඩ සම්මානය**: වයිඑම්කේ ප්‍රියදර්ශන, "ජංගම දුරකථනය හරහා පරිසරය දැනීම: අන්ධ තැනැත්තන් සඳහා පුද්ගලාරෝපණ සහ පැළඳිය හැකි බාධක හඳුනා ගැනීමේ පද්ධතියක්"; තෘතීය (තාක්ෂණය) සඳහා NBQSA **කුසලතා සම්මානය**: එස් වාන්දනී, ඩී. කිරිඇල්ල, කේ රණසිංහ, "ස්වරාලෝක (ශ්‍රී ලංකාවේ අන්ධ තැනැත්තන් සඳහා අනුවර්තක සංගීත ස්වර පුහුණුව)" සහ NBQSA තෘතීයික (ව්‍යාපාර) සඳහා **කුසලතා** සම්මාන දෙකක්: එන්වී පෙරේරා, එම්එම් විජේසූරිය, අයිඑස් විජේරත්න, "විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් සඳහා තොරතුරු සන්නිවේදනය පාදක අධ්‍යාපනය" සහ එස්ඩීඩබ්ලිව් ගුණවර්ධන, පීඑම් ද සිල්වා, ඩීඑස්බී කුලතුංග, "ප්‍රධාන පහර ගතික සහ රටා විචලන යොදා ගෙන ආක්‍රමණශීලී නොවන මානව ආතති හඳුනාගැනීම"

හොංකොංහි පැවති ආසියා පැසිෆික් තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්මාන උළෙලේ දී **Asia Pacific ICT Awards** (APICTA) වයිඑම්කේ ප්‍රියදර්ශන විසින් "ජංගම දුරකථනය හරහා පරිසරය සංවේදනය කිරීම: අන්ධ තැනැත්තන් සඳහා පුද්ගලාරෝපණ සහ පැළඳිය හැකි බාධක හඳුනා ගැනීමේ පද්ධතිය" වෙනුවෙන් **කුසලතා සම්මානය** දිනා ගන්නා ලදී . මෙම ව්‍යාපෘතිය ආචාර්ය විමලරත්න විසින් අධීක්ෂණය කරන ලදී.

වයි ලොකුගේ, පී මදුමාල්, ටී කුමාර හා එන් රණසිංහ විසින් නිපය වූ ස්වයංක්‍රීය මහපෙන්වීමේ රෝදපුටුව නිර්මාණය සඳහා 2013 **අන්තර් විශ්වවිද්‍යාල නවෝත්පාදන ශූරතාවලියේ දී දෙවැනි ස්ථානය** හිමි විය.

කණ්ඩායම් 77 ක් IEEEXtreone 7.0 තරඟයට සහභාගි වූ අතර විශිෂ්ටතමයන් අතුරින් ලෝකයේ 185 වන ස්ථානයට සහ කලාපයේ 55 වන ස්ථානයට UCSC පත් විය.

2013 වසරේ දී මාලබේ SLIIT ආයතනයේ පැවති **Code Fest** තරගාවලියේ දී UCSC ශිෂ්‍යයන් විසින් දෙවන ස්ථානය සඳහා රු. 30,000ක මුදල් ත්‍යාගයක් සමඟ **රිදී සම්මානය** දිනා ගන්නා ලදී. මෙම උත්සවය SLIIT ආයතනයේ පරිගණක පීඨය විසින් සංවිධානය කරන ලදී. UCSC හි "LocTip" මෙම සම්මානය දිනා ගත් කණ්ඩායම වන අතර එය මුල් අවස්ථාවේ දී තරගාවලිය සඳහා සහභාගී වූ විශ්වවිද්‍යාල කණ්ඩායම් 22 අතුරින් එකක් විය. LocTip කණ්ඩායමේ පීජීජී රන්දිකා (2012/CS/114); එම්එස් කුමාරගේ (2012/CS/075); එල්ජීආර්එච් පෙරේරා (2012/CS/103); ඒ එදිරිසූරිය (2012/IS/016); කේකේටීපී රණතුංග (2012/CS/112) යන අය UCSCහි පළමු වසර උපාධි අපේක්ෂකයින්ය.

UCSC හි හතරවැනි වසරේ ශිෂ්‍යයන් වන එස් අමරසිංහ, එම් අල්විස්, ඒ පෙරේරා යන අය ශ්‍රී ලංකා CERT ආයතනය විසින් සැප්තැම්බර් මස 25වැනි දින සංවිධානය කළ 2013 **CERT ආරක්ෂක ප්‍රශ්නාවලියේ** දී තෙවැනි ස්ථානය හිමි කර ගත්හ.

'Google I/O Extended Colombo – 2013' ශ්‍රී ලංකාවේ පළමු වරට පැවත් වූ **Google I/O extended** උත්සවය විය. UCSC ශිෂ්‍යයන් **1වැනි ස්ථානය** (එස්එස් කරුණාරත්න) සහ **2වැනි ස්ථානය** (ආර් පෙරේරා) දිනා ගත් මෙම Hackathon තරගාවලිය දින 1-2 දක්වා කාලයක් පැවැත්වෙන අතර එහි දී ශිෂ්‍යයන් විසින් තාක්ෂණය යොදාගෙන ක්‍රියාත්මක වන මෘදුකාංගයක් නිර්මාණය කරනු ලැබේ.

2013 නොවැම්බර් මස 30වැනි දින කොළඹ, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී පැවැත් වූ **යුනිලිවර් අභියෝගය** - ලිප්ටන් දක්ෂතා සොයා යාමේ තරඟයේ දී ශිෂ්‍යයෝ **දෙවැනි ස්ථානය** දිනා ගත්හ. පී සමරකෝන් (2011/CS/199); එස් මුතුතන්ත්‍රි (2011/CS/039); එන් ලක්මිණි (2011/ICT/029); එස් සුන්දරලිංගම් (2011/ICS/038) යන අය UCSC කණ්ඩායම් සාමාජිකයින් වූහ.

පී සමරකෝන් (2011/CS/199) කැලණිය විශ්වවිද්‍යාලයේ ගේවල් සමාජය විසින් සංවිධානය කළ 2013 **අන්තර් විශ්වවිද්‍යාල හොඳම කථිකයා** තරගාවලියේ දී **තෙවැනි ස්ථානය** හිමි කර ගත්තේය.

**කවිතා කුසලතා** තරඟය උගත් පරපුරේ විවිධ කලා දක්ෂතා ඉදිරිපත් කිරීමට, ගොඩනඟා ගැනීමට සහ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව උදා කර දෙමින් ශිෂ්‍යයින්ගේ නිර්මාණාත්මක කුසලතා ප්‍රවර්ධනය කරයි. එච්ඩී පෙරේරා (2010/ICT/032) ඉලෙක්ට්‍රොනික මාධ්‍ය - වසරේ නිර්මාණාත්මක රූපවාහිනී ප්‍රචාරකයා තරඟයේ දී **තෙවැනි ස්ථානය** හිමි කර ගත්තේය.

UCSC විසින් 2013 ජනවාරි මස 10වැනි දින පැවති 2012 ඊ-ස්වාභිමානී සම්මාන උළලේ දී සම්මාන 4ක් (ජයග්‍රාහකයින් දෙදෙනෙක් සහ ඇගයීම් සහතික දෙකක්) දිනා ගන්නා ලදී. "ක්ෂේත්‍ර කාලතුවක්කු අනුකාරක පද්ධතිය" පිළිබඳ කාර්යමණ්ඩල පර්යේෂණ ව්‍යාපෘතිය ඊ-විද්‍යාව සහ තාක්ෂණික කාණ්ඩයේ ජයග්‍රහණය අත් කර ගත් එක් ව්‍යාපෘතියක් විය. අනෙක් සියල්ල ශිෂ්‍ය ව්‍යාපෘති විය..

**ක්‍රීඩා**

ජීජීඩීඑම් ගනේපොල (2011/ICT/027); බීඑල්ඩබ් විතාරණ (2011/ICT/028) යන ශිෂ්‍යයන් දෙදෙනා මැලේසියාවේ පැවති 8 වන UITM ජාත්‍යන්තර ටෙනිස් ක්‍රීඩා තරඟ උළෙලට සහභාගී විය. ජීකේආර්බී ගජනායක (2012/CS/048) එම උළෙලේ දී බැඩ්මින්ටන් තරඟයට සහභාගී විය. එන්ජීඑන්එස්එස් මිහිඳුකුලසූරිය (2010/ICT/001); එම්පීසී පෙරේරා (2010/ICT/013); සී ද අල්විස් (2011/CS/032); එස් චන්ද්‍රසේකර (2011/ICT/031) ඔක්තෝබර් 22 – 27 දක්වා මැලේසියාවේ දී පැවති විශ්වවිද්‍යාල බෝට්ටු තරඟයට සහභාගී විය.

පහත දැක්වෙන UCSC ශිෂ්‍යයන් කොළඹ විශ්ව විද්‍යාලයේ එක් එක් ක්‍රීඩාව සඳහා නායකයා සහ උප-නායකයා ලෙස පත් කළ අතර UCSC කණ්ඩායම 2013 වර්ණ රාත්‍රියේ දී පහත සඳහන් කර ඇති කුසලාන දිනා ගත්තේය.

**මලල ක්‍රීඩා/ ජවන හා පිටිය**: මලල ක්‍රීඩාවල **සමස්ත ශූරතාවය** සඳහා වූ ඩීපී එදිරිසිංහ අභියෝගතා කුසලානය; (පිරිමි) මලල ක්‍රීඩා සඳහා වූ එම්ජීඩීසීඑච් මනතුංග අභියෝගතා කුසලානය, **පීඨ කුසලානය; වර්ණ ලැයිස්තුව (පිරිමි)** - එම්ජීඑම් පෙරේරා (2010/CS/193), එම්ඩබ්එස්සීඑස්වී විතානගේ (2010/CS/044); **වර්ණ ලැයිස්තුව (කාන්තා)**

කේජීඅයි සන්දීපනි (2011/CS/165); **නායක (පිරිමි)** එම්ඩබ්එස්සීඑස්වී විතානගේ (2010/CS/044); **උප-නායක (පිරිමි)** ඒඑම් පෙරේරා (2010/CS/193).

**බැඩ්මින්ටන්: වර්ණ ලැයිස්තුව (පිරිමි)** - එච්එල්සී පෙරේරා (2010/CS/109); **වර්ණ ලැයිස්තුව (කාන්තා)** - ඩීජීයූ අමරසිංහ (2010/CS/205), ටීඩීපී පිරිස් (2010/CS/105); **නායක (කාන්තා)** ටීඩීපී පිරිසි (2010/CS/105); **උප-නායක (කාන්තා)** ඩීජීයූ අමරසිංහ (2010/CS/205).

**බේස්බෝල් : වර්ණ ලැයිස්තුව (පිරිමි)** - එස් සුන්දරලිංගම් (2011/ICT/038), එල්ඒ විජේසිංහ (2011/CS/036).

**කැරම්; වර්ණ ලැයිස්තුව (පිරිමි)** - එන්.ටී. පිරිස් (2010/CS/171), ආර්ඩීඑස්සී කරුණාපාල (2010/CS/171), ජීසීආර් විතාරන (2010/CS/218); **වර්ණ ලැයිස්තුව (කාන්තා)** - පීඑම් කල්පනා අංජලී මාදුගොඩ (2011/CS/160), එච්එච්අයිඩී ෆ්ලොරන්ස් (2011/CS/062).

**චෙස්: වර්ණ ලැයිස්තුව (පිරිමි)** ඩීසී මාලිමගේ (2011/CS/195), ඒඑන් නෙත්මිනි (2010/CS/080); **චෙස් සමස්ත** ශූරතාව සඳහා සාලිය පරාක්‍රම අනුස්මරණ කුසලානය; 1993 (පිරිමි) **චෙස් සඳහා ඒකාබද්ධ සමාජ අභියෝගතා කුසලානය, පීය කුසලානය.**

**පාපන්දු: වර්ණ ලැයිස්තුව** - කේබීජීටීඑම් කුලසේකර (2011/CS/177).

**හොකී: වර්ණ ලැයිස්තුව (පිරිමි)** - ඒඒජේ හගීතා (2011/ICT/017); **(කාන්තා)** එල්ආර් එදිරිවීර (2010/ICT/081), පීඑම්එස්කේ පලන්සූරිය (2010/ICT/110), සීකේ වඩුගේ (2009/ICT/067), කේඑච්අයි වින්දායා (2010/ICT/063), කේජීඑච්යූ දේශප්‍රිය (2011/CS/208); (කාන්තා) හොකී සඳහා ආර් විජේරත්න මිය, **පීය කුසලානය; උප-නායක (කාන්තා)** පීඑම්එස්කේ පලන්සූරිය (2010/ICT/110).

**කරාටේ: සමස්ත ශූරතාවය;** කරාටේ **(පිරිමි) අභියෝගතා කුසලානය,** පීය කුසලානය; **වර්ණ ලැයිස්තුව (පිරිමි)** - ආර්එස්කේ සමරසිංහ (2010/ICT/061), අයිඒඩීකේසීඩබ් ගුණරත්න (2011/ICT/053); **(කාන්තා)** - එල්ජීඒ තිලංකා මිය (2011/ICT/063); **උප-නායක (පිරිමි)** අයිඒඩීකේසීඩබ්ලිවු ගුණරත්න (2011/ICT/013).

**මග හරහා දිවීම:** මග හරහා දිවීම සඳහා වූ UCSC **අභියෝගතා කුසලානය, පීය කුසලානය.**

**ඔරු පැදීම: වර්ණ ලැයිස්තුව - (පිරිමි)** එන්ඒඑන්එස්එස් මිහිඳුකුලසූරිය (2010/ICT/001)

**රග්බි: වර්ණ ලැයිස්තුව** - අයිඑන් දේවප්‍රිය (2011/ICT/026), ජීපීඑන් පෙරේරා (2010/ICT/058).

**පිහිනුම්: කුසලතා සහතිකය (කාන්තා)** - ජේකේයූආර්පී ජයවර්ධන මිය (2010/ICT/017); **වර්ණ ලැයිස්තුව (පිරිමි)** - ජීබීඑස් ද සිල්වා (2011/CS/168); **(කාන්තා)** - ජේකේයූආර්පී ජයවර්ධන මිය (2010/ICT/017); **උප-නායක (කාන්තා)** ජේකේයූආර්පී ජයවර්ධන මිය.

**ටයිකොන්ඩෝ: වර්ණ ලැයිස්තුව (පිරිමි)** - ඒපීටී විස්වකුල (2011/CS/049).

**ටෙනිස්: වර්ණ ලැයිස්තුව (පිරිමි)** - එච්එල්සී පෙරේරා (2010/CS/109); **(කාන්තා)** - ජීඒඩීඑම් ගනේපොල මිය (2011/ICT/027) හා බීඑල්ඩබ් විතාරණ මිය (2011/ICT/028)

**වොලිබෝල්:** 2013 - **වර්ණ ලැයිස්තුව (පිරිමි)** - ආර්එම්කේඑච් රණසිංහ (2010/CS/175)

උපාධි ප්‍රදානය

උපාධි වැඩසටහන් 4ක ශිෂ්‍යයන් 203ක් සඳහා උපාධි ප්‍රදානෝත්සවය පවත්වනු ලැබීය. ICT උපාධි පාඨමාලා සඳහා


ශිෂ්‍යයන් ඕනෑම උ/පෙ විෂය ධාරාවක් යටතේ තෝරා ගන්නා ලදී. මෙම සිසුන් සඳහා විෂය ධාරාවට අදාළව කාර්ය සාධනය 3 වන වගුවෙන් පෙන්වයි.

උපාධිය සම්පූර්ණ කිරීමෙන් මාස පහකට පසුව පැවැත්වූ උපාධි ප්‍රදානෝත්සවය අතරතුර සමීක්ෂණයක් සිදු කරන ලදී. උපාධිධාරීන් 220 දෙනා අතුරින් 217 දෙනෙක් (98.6%) සමීක්ෂණයට සහභාගී වූ අතර 199 දෙනෙකුට (91.7%) දැනටමත් රැකියා හිමි වී ඇති අතර 6 දෙනෙක් (2.8%) ඌන සේවානියුක්තියේ ද 10දෙනෙක් (4.6%) රැකියා විරහිතද වේ. රැකියාවල නියුතු කාන්තාවන්ගේ ප්‍රතිශතය (87%), පුරුෂයන්ට (94%) වඩා සුළු පහළ යාමක් වූ අතර දෙමළ (82%) සහ මුස්ලිම් ශිෂ්‍යයන්ට (80%) වඩා වැඩි සිංහල ශිෂ්‍යයින් (93%) සංඛ්‍යාවක් රැකියාවල නිරත වූහ. සියලුම රැකියා විරහිත තැනැත්තන් රු. 30,000ක් හෝ ඊට වැඩි වැටුපක් අපේක්ෂා කළ අතර රැකියා කළ තැනැත්තන් අතුරින් රු. 30,000ට අඩුවෙන් ඉපයූයේ 8%ක් පමණි. රැකියා කළ අය අතුරින් බහුතරය (48%) රු. 50,000කට වැඩියෙන් ඉපැයූ අතර ඇතැම් ශිෂ්‍යයන් රු. 100,000කට වැඩියෙන් ඉපැයූහ. බොහෝ දෙනෙක් පෞද්ගලික අංශයේ රැකියාවල නියුක්ත වූහ (87%).

3 වගුව: UCSC උපාධිධාරීන්ගේ කාර්ය සාධනය

| ඇතුළත් කර ගැනීම | පළමු | ඉහළ | පහළ | සමත් | එකතුව |
|---|---|---|---|---|---|
| BCSc | 1 | 0 | 8 | 88 | **97** |
| BICT | 0 | 5 | 17 | 34 | **56** |
| ගණිතය | 0 | 3 | 10 | 21 | **34** |
| ජීව විද්‍යාව | 0 | 0 | 5 | 6 | **11** |
| වාණිජ්‍යය | 0 | 1 | 1 | 4 | **06** |
| කලා | 0 | 1 | 1 | 3 | **05** |
| BSc CS | 12 | 17 | 10 | 0 | **39** |
| BSc ICT | 6 | 11 | 3 | 0 | **20** |
| ගණිතය | 1 | 5 | 3 | 0 | **09** |
| ජීව විද්‍යාව | 4 | 5 | 0 | 0 | **09** |
| වාණිජ්‍යය | 0 | 1 | 0 | 0 | **01** |
| කලා | 1 | 0 | 0 | 0 | **01** |
| එකතුව | 19 | 33 | 38 | 122 | 212 |

ඉංජිනේරු හා වෛද්‍ය රැකියා නියුක්තිය සමග UCSC උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය 1 රූප සටහනින් පෙන්වයි. උපාධි ප්‍රදානයෙන් මාස හතරකට පසුව ඒ හා සමානම සමීක්ෂණයක් බාහිර උපාධි පාඨමාලාව සඳහා පැවැත්වූ විට උපාධිධාරීන් 172 ක් අතුරින් 81% ක් රැකියා නියුක්තිකයින් වූ අතර 6% ක් රැකියා සොයන්නන් වූහ.




රූප සටහන 1: විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගේ රැකියා හැකියාව

**සම්මාන**

UCSCහි විශිෂ්ටතම උපාධිධාරියා සඳහා වූ මහාචාර්ය වී.කේ. සමරනායක පදක්කම එල්.එන්. කුමාර් වෙත ප්‍රදානය කරන ලදී. උපාධි වැඩසටහනේ දී පරිගණක අධ්‍යායන සඳහා වූ මහාචාර්ය මොහාන් මුණසිංහ සම්මානය, කාර්මික පුහුණුව පිළිබඳ හොඳම කාර්යසාධනය සඳහා වූ ඩේවිඩ් පිරිස් සමූහ ව්‍යාපාරයේ රන් පදක්කම හා හොඳම

කාර්යසාධනය සඳහා වූ Virtusa අධ්‍යයන විශිෂ්ටතා සම්මානය යන සම්මාන තුන පිළිවෙලින් එල්එන් කුමාර්, එච්එම්එල් ධර්මසිරි හා ආර්ආර්ඩීඑච් වත්සලා යන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පිරිනමන ලද අතර අවසන් වසරේ හොඳම පරිගණක විද්‍යා ව්‍යාපෘතිය සඳහා වූ CINTEC සම්මානය එල්එන් කුමාර් ශිෂ්‍යයා විසින් දිනා ගන්නා ලදී. තොරතුරු සන්නිවේදන තාක්ෂණ වැඩසටහනේ එස්පී උදලාගම, එම්ඩීඑන්ටී පෙරේරා සහ ආර්අයිඑම් සබිත් යන අය සඳහා පිළිවෙළින් හොඳම කාර්යසාධනය සඳහා වූ IFS අධ්‍යයන විශිෂ්ටතා සම්මානය, කාර්මික පුහුණුවේ හොඳම කාර්යසාධනය සඳහා වූ ඩේවිඩ් පීරිස් සමූහ ව්‍යාපාරයේ රන් පදක්කම හා හොඳම කාර්යසාධනය සඳහා වූ මෝටරෝලා අධ්‍යයන විශිෂ්ටතා සම්මානය යන සම්මාන තුන පිරිනමන ලදී. තොරතුරු සන්නිවේදන තාක්ෂණ වැඩසටහනේ අවසන් වසරේ හොඳම ව්‍යාපෘතිය සඳහා වූ සම්පත් බැංකු සම්මානය පීඅයියූ අමරසිංහ, ඒකේ මඩුගල්ල, වීඑච් පද්මතිලක සහ ආර්එන් රාජපක්ෂ යන අයට පිරිනමන ලදී.

අප විසින් බිහි කරනු ලබන ශිෂ්‍යයන්ගේ ගුණාත්මක භාවය කෙරෙහි එය දායක වන බැවින් යහපත් ශිෂ්‍යයන් ආකර්ෂණය කර ගැනීම අප සැලකිලිමත් වන මූලික කරුණ වේ. උපාධි අපේක්ෂක වැඩසටහන් සඳහා ලියාපදිංචි වන ශිෂ්‍යයන් තෝරාගැනීම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම (UGC) විසින් මධ්‍යගතව සිදු කරයි. එය සිසුන්ගේ අභිමතය මත පදනම් වේ. වර්තමානයේ බොහෝ සිසුන්ගේ පළමු තේරීම ඉංජිනේරු හෝ වෛද්‍ය වේ. එසේම බොහෝ සිසුන් UCSC උපාධි වැඩසටහන් සහ පරිගණක ක්ෂේත්‍රයේ වෘත්තීය අවස්ථාවන් පිළිබඳ නොදැනුවත්ය. එම නිසා දෙදින වැඩමුළු හැකියාව ඇති හොඳ සහභාගිත්වයකින් යුත් නව ඇතුළත් වීම් සඳහා සංවිධානය කිරීම නොනවත්වා UCSC කරගෙන යයි. මේ දක්වා අභ්‍යන්තර වැඩසටහන් සඳහා ලියාපදිංචි වීමේ අවස්ථාව ඒ සඳහා උනන්දුවක් දක්වන්නන්ට හිමි වී නොමැත.

**පශ්චාත් උපාධි අධ්‍යාපනය**

පශ්චාත් උපාධි වැඩසටහන් 1986 වසරේ දී පළමු වරට කොළඹ දී පිරිනමනු ලැබුවේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් හරහා ය. සමාලෝචිත වර්ෂය තුළ දී UCSC විසින් විශාරද උපාධි පාඨමාලා තුනක් (03) අඛණ්ඩව පවත්වන ලදී. පරිගණක විද්‍යා පාඨමාලාව හෝ පරිගණක පිළිබඳව ප්‍රථම උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් ඇති අය සඳහා අදහස් කළ පාඨමාලාවක් වන අතර තොරතුරු තාක්ෂණය පිළිබඳව වැඩසටහන උපාධිධාරීන් සහ වෙනත් විෂයන්වල වෘත්තිකයින් සඳහා සකස් කර ඇත. MIT වැඩසටහනට ඊ-ඉගෙනුම සහ බහු-මාධ්‍ය විෂයන් ඇතුළත් වේ. විද්‍යාවේදී තොරතුරු සුරක්ෂිතතාව වැඩසටහන නිර්මාණය කර ඇත්තේ තොරතුරු සුරක්ෂිතතාව ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වන උපාධිධාරීන්ටය. මෙම වැඩසටහන මගින් තොරතුරු තාක්ෂණය, තොරතුරු පද්ධති විගණනය සහ තොරතුරු සුරක්ෂිතතාව යන ක්ෂේත්‍රවල නිරතවන්නන්ට මධ්‍ය වෘත්තීය අවස්ථා පිරිනමයි.

UCSC විසින් පිරිනමන විශාරද වැඩසටහන් වසර දෙකක අර්ධ කාලීන පාඨමාලා වන අතර අධ්‍යයන කාලපරිච්ඡේද හතරකින් සමන්විත වේ. 2012/2013 වර්ෂය සඳහා වූ ශිෂ්‍ය කණ්ඩායම සඳහා වූ පාඨමාලා 2012 දෙසැම්බර් මස ආරම්භ කරන ලදී. 2013/2014 වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම, තෝරා ගැනීමේ පරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම තුළින් වර්ෂය තුළ දී ආරම්භ කරන ලදී. 2014 වර්ෂයේ මුල් කාලයේ දී වැඩසටහන ආරම්භ කිරීම සඳහා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගන්නා ලදී.

සමස්තයක් ලෙස අභ්‍යන්තර කාර්යමණ්ඩල සාමාජිකයින් 30 දෙනෙක් සහ බාහිර කථාකාචාර්යවරුන් කීපදෙනෙක් මෙම වැඩසටහන සඳහා සිය දායකත්වය සැපයීය. 2013 දෙසැම්බර් මාසයෙන් අවසන් වර්ෂය තුළ ශාස්ත්‍රපති උපාධිය හිමි කර ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 303කි. ශාස්ත්‍රපති වැඩසටහන්වලින් උපයා ගත් ආදායම සැලකිය යුතු මට්ටමකින් UCSC උත්පාදිත අරමුදල සඳහා දායක කර ගත් අතර එහි යටිතලපහසුකම් සහ පර්යේෂණ කටයුතු කෙරෙහි අනුග්‍රහය සැලසීමේ දී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

වර්තමානය වන විට UCSC විසින් විශාරද උපාධි වැඩසටහන් තුනක් පිරිනමන අතර පර්යේෂණ උපාධි සඳහා ශිෂ්‍ය-ශිෂ්‍යාවන් 353 දෙනෙක් සිටිති (4වැනි වගුව). පරිගණක විද්‍යාපති උපාධි වැඩසටහන 1990 වර්ෂයේ සිට පිරිනමනු ලබන අතර මේ වන විට එහි ශිෂ්‍යයන් 128 දෙනෙක් සිටියි. තොරතුරු තාක්ෂණ වැඩසටහන 2000 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන අතර එහි ශිෂ්‍යයන් 123 දෙනෙක් සිටියි. තොරතුරු ආරක්ෂණ වැඩසටහන සඳහා සිටින ශිෂ්‍යයන් සංඛ්‍යාව 52කි. IBMBB සමගින් පිරිනමනු ලබන නව ජෛව-තොරතුරු වැඩසටහන සඳහා ශිෂ්‍යයන් 13දෙනෙක් සිටියි. පර්යේෂණ සිසුන් 46දෙනෙක් දර්ශනපති/දර්ශනශූරී උපාධි සඳහා සිය පර්යේෂණ කටයුතු පවත්වයි. වැඩිම සංඛ්‍යාවක පර්යේෂණ ශිෂ්‍ය සංඛ්‍යාවක් මෙම වර්ෂය තුළ දී උපාධි හිමිකර ගැනීම තුළින් පර්යේෂණ සම්බන්ධයෙන් ඇති කරන විශේෂ බලපෑම සහ අවධාරණය ඉතා හොඳින් නිරූපණය වේ.

2013 වර්ෂය තුළ දී දර්ශනපති උපාධි වැඩසටහන සඳහා නවක සිසුන් (අර්ධ-කාලීනව 5ක් සහ පූර්ණ කාලීනව 4ක් වශයෙන්) නව දෙනෙක් ලියාපදිංචි වූහ. එමෙන්ම අර්ධ-කාලීන ශිෂ්‍යයෙක් සහ පූර්ණ-කාලීන ශිෂ්‍යයන් තිදෙනෙක්

2013 වර්ෂය තුළ දී දර්ශනශූරි උපාධිය සඳහා ලියාපදිංචි වූහ.

වගුව 4: පශ්චාත් උපාධි වැඩසටහන්

| පාඨමාලාව | ඇතුළත් කර ගැනීම 2012 | 1 වන වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | එකතුව | උපාධි ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| පරිගණක විද්‍යාපති | 68 | 68 | 60 | - | - | 128 | 51 |
| තොරතුරු තාක්ෂණපති | 66 | 66 | 57 | - | - | 123 | 56 |
| තොරතුරු සුරක්ෂිතතාවය පිළිබඳ විද්‍යාපති | 26 | 26 | 26 | - | - | 52 | 09 |
| පරිගණක විද්‍යා විද්‍යාවේදී උපාධිය | - | - | - | - | - | - | 01 |
| පරිගණක විද්‍යා විද්‍යාවේදී උපාධිය | - | - | - | - | - | - | 02 |
| තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - | - | - | - | 03 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා හැදෑරූ | 160 | 160 | 143 | 0 | 0 | 303 | 122 |
| පර්යේෂණ (දර්ශනපති/දර්ශන විශාරද) | 09 | 09 | 08 | 09 | 13 | 39 | 06 |
| එකතුව | 169 | 169 | 151 | 09 | 13 | 342 | 128 |

සියලු පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි

**සම්මාන**

2013 නොවැම්බර් මස 21වැනි දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය පවත්වන ලදී. පරිගණක විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහනේ හොඳම ශිෂ්‍යයා සඳහා වූ Kingslake සම්මානය එම්.ඩී.එස්. දිනුෂ්ක මහතා වෙත පිරිනමන ලද අතර තොරතුරු සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහනේ හොඳම ශිෂ්‍යා සඳහා වූ JICA සම්මානය ජී.ඒ.ඩී.පී.එස්. සෙනෙවිරත්න මෙය වෙත පිරිනමන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සම්මානය (UCSC) – 2012 UCSC හි අධ්‍යක්ෂ මහාචාර්ය ජී.එන්. වික්‍රමනායක මයා වෙත පිරිනමන ලදී.

බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා

ආරම්භ කර ඇති බාහිර උපාධි පාඨමාලාව සඳහා ශිෂ්‍යයන් 5,722ක් බඳවා ගත් අතර ශිෂ්‍යයන් 309ක් ව්‍යාප්ති පාඨමාලා හැදෑරීය. මෙයට අමතරව UCTIT වැඩසටහනේ ශිෂ්‍යයන් 13,814 දෙනෙක් විභාගවලට පෙනී සිටියහ. FIT වැඩසටහන සඳහා ශිෂ්‍යයන් 930ක් ලියාපදිංචි වූ අතර වසර තුළ ශිෂ්‍යයින් 1127ක් විභාගවලට මුහුණ දුන්හ. විද්‍යුත්-ඉගෙනුම් මධ්‍යස්ථානය **සම්පත් බැංකුව සඳහා මාර්ගගත භාෂා සේවාව (දෙමළ) සපයන ලද අතර ක්‍රීඩා අමාත්‍යාංශ පුහුණු මධ්‍යස්ථානය සඳහා මිශ්‍ර ඉගෙනුම් පරිසර සහාය සපයා දෙන ලදී.**

BIT වැඩසටහන ආරම්භයේ සිට ශිෂ්‍යයින් 29,179ක් ආකර්ෂණය කරගෙන ඇති අතර උපාධිධාරීන් 1,436 දෙනෙක් ද උසස් ඩිප්ලෝමාධාරීන් 2,788 දෙනෙක් ද ඩිප්ලෝමාධාරීන් 6,003 දෙනෙක් ද බිහි කර ඇත. 2012/13 දී නව බඳවා ගැනීම් 2034ක් සිදු කළ අතර ඉහළම උපාධිධාරීන් සංඛ්‍යාවක් බිහි කර ඇත (5වැනි වගුව). නාමික ශාස්තුවක් යටතේ අමාත්‍යාංශයේ NODES මධ්‍යස්ථාන හරහා පරිගණක සම්පත් වෙත ප්‍රවේශ වීමේ අවස්ථාව ලබා දීම වසර තුළ සිදු කරන ලදී. 2013/14 සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය ද වසර තුළ ආරම්භ කළ අතර වසර අවසානයට පෙර 2000කට වැඩි බඳවා ගැනීම් සිදු කරන ලදී.

වගුව 5: බාහිර උපාධි වැඩසටහන් 2012/13

| පාඨමාලාව | ඇතුළත් කර ගැනීම | 1 වන වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | එකතුව | උපාධි ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා | 2034 | 2816 | 1045 | 314 | 4175 | 611 |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමා | 714 | 1045 | 501 | 845 | 2391 | 305 |
| තොරතුරු තාක්ෂණවේදී | 312 | 314 | 531 | 571 | 1416 | 194 |
| මුළු | | **2811** | **1545** | **1416** | **5722** | |

ඉලක්ක සමගම ලියාපදිංචි සහ උපාධි ලත් සංඛ්‍යාව හඳුනා ගනිමින් පසුගිය වර්ෂ තුන පුරා BIT ශිෂ්‍යයන්ගේ කාර්යසාධනය, වගුව 6 න් ඉස්මතු කර දක්වයි.

විෂයමාලා වෙනස් කිරීම් පැහැදිලි කිරීම සඳහා සහ ආයතනික ප්‍රතිචාර ලබා ගැනීම සඳහා මැයි මස 30වැනි දින BIT ආයතනික රැස්වීම පවත්වන ලදී. hSenid විසින් BIT පළමු වසර සිසුන්ගේ ආධුනිකත්ව වැඩසටහන හඳුන්වාදීම සඳහා වූ රැස්වීමක් මැයි මස 30වැනි දින සංවිධානය කරන ලදී. **BIT විභාග පරීක්ෂණ කොළඹ, නුවර, ගාල්ල සහ යාපනයේ දී පවත්වන ලදී.**

වගුව 6: පසුගිය වර්ෂ තුන පුරා බාහිර උපාධි කාර්ය සාධනය

| බාහිර උපාධි අපේක්ෂකයන් | KPI | 2010/11 | 2011/12 | 2012/13 |
|---|---|---|---|---|
| DIT - නව ඇතුළත් කරගැනීම | **2000** | 2514 | 2365 | 2034 |
| DIT – ලියාපදිංචි වූ | 4000 | 4281 | 4287 | 4175 |
| DIT - ඩිප්ලෝමා | **600** | **576** | **654** | **611** |
| HDIT - උසස් ඩිප්ලෝමා ඇතුළත් කරගැනීම | **600** | 549 | 648 | 714 |
| HDIT - උසස් ඩිප්ලෝමා සඳහා ලියාපදිංචි වූ | 2000 | 1863 | 2019 | 2391 |
| HDIT - උසස් ඩිප්ලෝමා | **300** | **308** | **262** | **305** |
| BIT - උපාධි ඇතුළත් කරගැනීම | **300** | 228 | 279 | 312 |
| BIT - උපාධි සඳහා ලියාපදිංචි වූ | 1200 | 1188 | 1293 | 1416 |
| BIT - උපාධිධාරීන් | **150** | **129** | **172** | **194** |

### උපාධි ප්‍රදානය

2013 අප්‍රේල් 5වන දින පවත්වන ලද 2012 උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වූවන්ගේ කාර්යසාධනය වගුව 7 හි පෙන්වා ඇත. මෙම උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධිධාරීන් 172 දෙනෙකුට උපාධි පිරිනැමිණි. ඔවුන්ගේ ව්‍යාපෘති විභාගවලින් මාස තුනකට පසුව පැවැත් වූ රැකියා සමීක්ෂණයට 94% දෙනෙක් ප්‍රතිචාර දැක්වූහ. 131 දෙනෙක් (81%) දැනටමත් රැකියාවල නිරත වූ අතර ඔවුන්ගෙන් 10 දෙනෙක් (6%) වඩාත් හොඳ රැකියා සොයමින් සිටියහ. 11 දෙනෙක් (7%) සිය අධ්‍යාපන කටයුතු දිගටම කර ගෙන යන අය වූ අතර අනෙක් අය රැකියා නොමැති වීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළේ නැත. පසුගිය වසර දෙක ඇතුළත රැකියා නියුක්ති ප්‍රතිශතය පිළිවෙලින් 87%ක් සහ 86%ක් විය. කෙසේ වුවද ඊළඟ ශිෂ්‍ය කණ්ඩායමේ ප්‍රතිඵල නිකුත්වීමත් සමඟ 194ක වාර්තාගත ශිෂ්‍ය සංඛ්‍යාවක් BIT උපාධිය සඳහා සුදුසුකම් ලැබූහ.

වගුව 7: 2013 දී පැවති උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධි ලැබූවන්

| ඇතුළත් කර ගැනීම | පළමු | ඉහළ | පහළ | සමත් | එකතුව |
|---|---|---|---|---|---|
| BIT | 5 | 2 | 15 | 150 | **172** |

**සම්මාන**

තොරතුරු තාක්ෂණවේදී (බාහිර) උපාධියේ විශිෂ්ටතම කාර්යසාධනය සඳහා පිරිනමන මහාචාර්ය වී.කේ. සමරනායක පදක්කම බී.ඒ. රත්නායක මෙය වෙත ප්‍රදානය කරන ලදී. ඇයට විශිෂ්ටතම තනි පුද්ගල ව්‍යාපෘති සම්මානයද පිරිනමන ලදී. එම්.ජේ.පී.යූ. සමන්තිලක අනුස්මරණ සම්මානය ලෙස නව සම්මානයක් හඳුන්වා දෙනු ලැබීය. මෙම සම්මානය ටී.ඒ. ප්‍රනාන්දු මෙය වෙත ප්‍රදානය කරන ලදී. සෙමෙස්තර 4 සඳහා විශිෂ්ටතම e-Learner සම්මාන එම්.පී. විමලසූරිය මෙය (I සහ II), ආර්.එම්.එස්.එස්. බණ්ඩාර මයා (III) වෙත ප්‍රදානය කරන ලද අතර IV සඳහා එය ප්‍රදානය නොකරන ලදී.

**ආයතන**

බොහෝ පුහුණු කිරීමේ ආයතන BIT අපේක්ෂකයන් සඳහා මුහුණට මුහුණ පන්ති සහ ඉගෙනුම් සහාය පිරිනමයි. මෙම ක්‍රියාදාමය සඳහා 200 කට අධික ආයතන සංඛ්‍යාවක් සහභාගී වන අතර සමහර අධ්‍යයන වර්ෂවල ආයතන 50 ක් පමණ වේ. UCSC එම ආයතන වෙත බලය පවරන්නේ නැති නමුත් වැඩසටහනේ ප්‍රගමනයට ඔවුන්ගේ දායකත්වය හඳුනා ගනී. සෑම වසරකම UCSC එක් එක් පාඨමාලාවල ආයතන අනුව විභාග ප්‍රතිඵල සාරාංශයක් ප්‍රකාශයට පත් කරයි. එම නිසා අයදුම්කරුවන්ට තිබෙන ආයතන හඳුනාගැනීමට සහ ඔවුන්ගේ ඉගෙනුම් ක්‍රමය සැලසුම් කිරීමට හැකි වේ. අයදුම්කරුවන්ගෙන් හරි අඩකට වඩා වැඩි සංඛ්‍යාවක් ඔවුන් විසින්ම VLE සහ මාර්ගගත/ නිර්දේශිත ද්‍රව්‍යවල සහායෙන් හැදෑරීම සිදු කරයි. 2012/13 දී, දිස්ත්‍රික්ක 11කින් ආයතන 36ක් අයදුම්කරුවන් පස් දෙනෙකුට හෝ ඊට වැඩි පිරිසකට පුහුණු කිරීම් පැවැත්වීය. ඒ අතුරින් ආයතන 11ක් අවුරුදු තුන සඳහාම සම්බන්ධ විය (වගුව 8 හි * ලෙස සලකුණු කොට ඇත).

වගුව 8: BIT වැඩසටහන සමග සම්බන්ධ වූ ආයතන

| දිස්ත්‍රික්කය | ආයතනය |
|---|---|
| බණ්ඩාරවෙල | (1) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස් |
| මඩකලපුව | (1) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(2) ඇඩ්වෙන්චර් ඉන්ස්ටිටියුට් ඔෆ් අයිටී |
| කොළඹ | (1)* අර්ත් ඉන්ටර්නැෂනල්<br>(2) *ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(3) අයිටී වෘත්තිකයන්ගේ පදනම<br>(4) *IDM කොම්පියුටර් ස්ටඩීස්<br>(5) *මැට්රික්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් අයිටී<br>(6) *ඕපන්ආර්ක් ස්කූල් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි<br>(7) *වයිඩ්අවේක් සොලූෂන්ස්<br>(8) අවුරෝරා කොම්පියුටර් ස්ටඩීස්<br>(9) ඊ-ඇකඩමි කොම්පියුටර් ස්ටඩීස්<br>(10) ඊජ්එස්එල් ජේ ලන්කා<br>(11) ෂාජ් විෂන් අයිටී සෙන්ටර්<br>(12) ටෙක්නොවුරා කොලේජ් ඔෆ් එඩියුකේෂන් |
| ගාල්ල | (1) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(2) IDM කොම්පියුටර් ස්ටඩීස් |
| ගම්පහ | (1) * අර්ත් ඉන්ටර්නැෂනල්<br>(2) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්, ගම්පහ<br>(3) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්, මීගමුව<br>(4) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්, කැලණිය |
| යාපනය | (1) BIT කෝනර්<br>(2) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(3) MIS<br>(3) Mobile@Net කොම්පියුටර් සර්විසස් |

| | |
|---|---|
| නුවර | (1) *ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(2) මැට්රික්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් අයිටී<br>(3) සමුපකාර සංවර්ධනය පිළිබඳ ජාතික ආයතනය |
| කෑගල්ල | (1) ඉන්ස්ටිටියුට් ඔෆ් කොම්පියුටර් ස්ටඩීස්<br>(2) සොලරිස් කොම්පියුටර් ස්ටඩීස් |
| කුරුණෑගල | (1) *ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(2) ඉන්ස්ටිටියුට් ඔෆ් බිස්නස් ස්ටඩීස් |
| මාතර | (1) *ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(2) ඕබෙස් ස්කූල් ඔෆ් කොම්පියුටින්ග්<br>(3) IDM කොම්පියුටර් ස්ටඩීස් |
| රත්නපුර | (1) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස් |

UCSC විසින් ව්‍යාප්ති සහතික පත්‍ර පාඨමාලා අටක් පිරිනැමූ නමුත්, එම පාඨමාලාවලට ඇති ඉල්ලුමෙහි අඩුවක් පෙන්වමින් ආකර්ෂණය කර ගන්නා ලද්දේ සිසුන් 300 ක් පමණි. UCSC විසින් පවත්වනු ලබන CSC පාඨමාලා (වැඩසටහන්) විස්තර වගුව 9 මගින් දැක්වෙයි.

වගුව 9: CSC පුහුණු පාඨමාලා

| පාඨමාලාව | B | P |
|---|---|---|
| JavaSE භාවිතයෙන් ජාවා යෙදුම් සංවර්ධනය | 2 | 35 |
| JavaEE භාවිතයෙන් උසස් ජාවා යෙදුම් සංවර්ධනය | 2 | 51 |
| Unix Linux ජාල සහ පද්ධති පරිපාලනය | 2 | 78 |
| උසස් බහුමාධ්‍ය වෙබ් නිර්මාණකරණය සහ සංවර්ධන ශිල්ප ක්‍රම | 2 | 28 |
| PHP සහ MySql සමගින් ගතික වෙබ් යෙදුම් සංවර්ධනය | 2 | 25 |
| AutoCAD 2010 භාවිතයෙන් පරිගණක සහායයෙන් සැලසුම් ඇඳීම | 1 | 36 |
| මයික්‍රොකොන්ට්‍රෝලර් වැඩසටහන්කරණය (රොබෝ තාක්ෂණය ඇතුළුව) භාවිතයෙන් එබ්බවූ පද්ධති සැලසුම සහ සංවර්ධනය | 2 | 20 |
| පරිගණන ජීව විද්‍යාව | 1 | 36 |
| එකතුව | 14 | 309 |

විදේශීය ශිෂ්‍යයන්

කලාපය තුළ විශිෂ්ට මධ්‍යස්ථානයක් ලෙස පිළිගැනීම සඳහා විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීම වැදගත්ය. විදේශීය සිසුන් ලියාපදිංචි කිරීමේ ප්‍රවර්ගය තිබුණද වෙනත් ස්ථානයක උ/පෙ කළ සිසුන් වුවත් මෙතෙක් අයදුම් කර ඇත්තේ දේශීය සම්බන්ධතා මතය. 2011 දී විදේශීය සිසුන් ප්‍රවර්ගය යටතේ පළමු සිසුවා CS උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි විය. මෙම වසරේදී අප පළමු වරට තොරතුරු තාක්ෂණපති වැඩසටහන සඳහා පළමු සිසුවා භූතානයෙන් ඇතුළත් කර ගන්නා ලදී. වගුව 10 හි විදේශීය සිසුන් ඇතුළත් කර ගැනීමේ විස්තර දක්වා ඇත.

වගුව 10: විදේශීය ශිෂ්‍යයන්

| පාඨමාලාව | මාධ්‍යය | ඇතුළත් කර ගැනීම | 1 වන වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | උපාධි ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| පරිගණක විද්‍යාව | ඉංග්‍රීසි | - | - | 01 | - | - | - |
| MIT | ඉංග්‍රීසි | 01 | 01 | - | - | - | - |

ආරම්භ කළ නව පාඨමාලා

විෂයමාලා සංශෝධනය හා උපාධි වැඩසටහන්වල වෙනස්කම් හේතුවෙන් BICT වැඩසටහන BIS ලෙස නැවත නම් කරන ලදී. කෙසේවුව ද මෙම පාඨමාලාවට සමාන පාඨමාලාවක් එයට පෙර ක්‍රියාත්මක වූ බැවින් මෙම පාඨමාලාව නව පාඨමාලාවක් ලෙස සැලකිය නොහැකිය. කෙසේවුව ද පරිගණක විද්‍යාව පිළිබඳ නව විද්‍යාවේදී උපාධියේ ශිෂ්‍ය කණ්ඩායමට වසර 2015 දී ඔවුන්ගේ 3වන වසරේදී නව මෘදුකාංග ඉංජිනේරු ශිල්පය තෝරා ගැනීමට අවස්ථාවක් ලැබෙනු ඇත. උපාධිය දක්වා දිවෙන නව සහතිකපත්‍ර වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර නිපුණතා වැඩසටහන (ICIT) පැවැත්වීම සඳහා **FITIS, NODES** සහ **UCSC** අතර අවබෝධතා

ගිවිසුමක් අත්සන් කරන ලදී.

වගුව 11: නව පාඨමාලා

| පාඨමාලාව | මාධ්‍යය | සහතික | ඩිප්ලෝමා | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | විශාරද | දර්ශනපති | පශ්චාත් උපාධි |
|---|---|---|---|---|---|---|---|
| මෘදුකාංග ඉංජිනේරු | ඉංග්‍රීසි | - | - | - | - | - | - |
| ICIT | ඉංග්‍රීසි | - | - | - | - | - | - |

## පර්යේෂණ

### පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන

විවිධ පර්යේෂණ කණ්ඩායම් යටතේ හා පර්යේෂණ ශිෂ්‍යයන් හරහා පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක වෙයි (වගුව 13). UCSC ප්‍රධානවම පර්යේෂණ කටයුතුවල උන්නතියට යොමු වන දර්ශනපති වැඩසටහන් සඳහා පූර්ණකාලීන/අර්ධකාලීන (FT/ PT) පරිගණක විද්‍යාව/ඉංජිනේරු උපාධිවලට යහපත් පළමු මට්ටමේ ප්‍රතිඵල සහිත උපාධිධාරීන් ඇතුළත් කර ගනී. වර්ෂය අතරතුර නවක සිසුන් 13 දෙනෙකු ලියාපදිංචි වූ අතර එක් ඇගයීමක් පැවැත්විණි. වර්තමානයේදී UCSC හි ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් 16 දෙනෙක් සහ බාහිර පර්යේෂකයන් 10 දෙනෙක් යටතේ සිසුන් 52 දෙනෙකු විෂය ධාරා 22 ක් යටතේ වැඩ කරයි. දර්ශනපති/දර්ශනශූරී උපාධි සඳහා යොමුවූ පර්යේෂණ 14ක් මේ වන විට අවසන් කර ඇත. මෙම වසර තුළ දර්ශනපති/දර්ශනශූරී ශිෂ්‍යයන් 13 දෙනෙකුගේ ප්‍රකාශන තිබුණි.

සමාජ ජීවිත ජාල පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා සති 3 ක් ගත කිරීමට ඔක්/නොවැ තුළ බටහිර සිඩ්නි විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ගිනිගේ UCSC වෙත පැමිණියේය. එම ව්‍යාපෘතියම සඳහා ඔහු 2013 ජනවාරිවලදීද UCSC වෙත පැමිණියේය.

වගුව 12: කාර්ය මණ්ඩල පර්යේෂණ ක්ෂේත්‍ර

| පර්යේෂණ ක්ෂේත්‍රය | FT | PT | එකතුව | නව | සම්පූර්ණ කළ |
|---|---|---|---|---|---|
| කෘත්‍රිම බුද්ධිය | 0 | 1 | **1** | 2 | 0 |
| ජෛවතොරතුරුවේදය | 0 | 0 | **0** | 0 | 1 |
| පරිගණක ග්‍රැෆික් | 4 | 2 | **6** | 1 | 1 |
| දත්ත කැණීම | 1 | 0 | **1** | 0 | 0 |
| අංකිත අධිකරණ වෛද්‍ය විද්‍යාව | 1 | 0 | **1** | 0 | 0 |
| ඊ-ව්‍යාපාර | 0 | 1 | **1** | 0 | 0 |
| ඊ-සෞඛ්‍යය | 0 | 1 | **1** | 0 | 0 |
| ඊ-ඉගෙනුම | 3 | 2 | **5** | 2 | 3 |
| ක්‍රීඩා පදනම් ඉගෙනුම | 0 | 1 | **1** | 0 | 0 |
| භූගෝලීය තොරතුරු පද්ධති | 1 | 1 | **2** | 0 | 1 |
| හරිත තොරතුරු තාක්ෂණය | 1 | 0 | **1** | 0 | 0 |
| ඉහළ කාර්යසාධනය | 0 | 0 | **0** | 0 | 1 |
| හියුරිස්ටික ප්‍රශස්තකරණය | 0 | 1 | **1** | 0 | 0 |
| මානව පරිගණක අන්තර්ක්‍රියාකාරිත්වය | 1 | 0 | **1** | 0 | 0 |
| අනුරූ පිරිසැකසුම | 1 | 2 | **3** | 1 | 2 |
| තොරතුරු පද්ධති | 1 | 0 | **1** | 1 | 0 |
| බුද්ධිමය පද්ධති | 0 | 1 | **1** | 0 | 0 |
| දැනුම් ඉංජිනේරුකරණය | 1 | 0 | **1** | 1 | 0 |
| යන්ත්‍ර ඉගෙනුම | 1 | 2 | **3** | 0 | 2 |
| ස්වභාවික භාෂා පිරිසැකසුම | 2 | 1 | **3** | 0 | 2 |
| සංවේදන ජාල | 1 | 3 | **4** | 0 | 0 |
| මෘදුකාංග ඉංජිනේරුකරණය | 0 | 1 | **1** | 1 | 1 |
| **එකතුව** | **19** | **20** | **39** | **9** | **14** |

UCSC හි පර්යේෂණ නගා සිටුවීම සඳහා පර්යේෂණ අරමුදලක් 2009 උපයෝගීතා මෙහෙයුම් ප්‍රතිපත්තිය සමගින් පිහිටුවනු ලැබිණි. මිලියන 4ක ආරම්භක දායකත්වය දර්ශනපති සහ BIT වෙතින් වූ මෙම අරමුදල උත්පාදිත අරමුදල් හරහා අඛණ්ඩව වර්ධනය වී ඇති අතර එය දැන් මිලියන 43 ක්ව පවතී. ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩලයට පර්යේෂණ හමු සඳහා සහභාගි වීමට සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ සඟරාවල පර්යේෂණ පළ කිරීම සඳහා වාර්ෂිකව රු. 350,000 දක්වා උපයෝජනය කරගත හැකි විය. මෙය, වාර්ෂික UCSC ප්‍රකාශන 30 සිට 60 ගණන් දක්වා වැඩි කරන ලදී. වර්ෂයේ ප්‍රකාශන අතුරින් 58ක් රටවල් 18ක පවත්වන ලද සම්මන්ත්‍රණ පත්‍ර වේ. අධ්‍යායන කාර්ය මණ්ඩලයේ 25 (71%) දෙනෙක් පර්යේෂණ පත්‍ර පළ කළහ. ප්‍රකාශනවල විස්තර වගුව 13 න් දැක් වේ.

වගුව 13: පර්යේෂණ සාරාංශය

| විෂයය | පළ කළ | වාණිජකරණය කළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| පර්යේෂණ සංඛ්‍යාව | 114 | - | 59 |
| නවෝත්පාදන සංඛ්‍යාව | - | - | - |
| සඟරා සංඛ්‍යාව | 8 | - | - |
| පොත් සංඛ්‍යාව | - | - | - |
| ලිපි සංඛ්‍යාව | 59 | - | - |
| වෙනත් | - | - | - |
| එකතුව | 67 | - | 59 |

## සම්මේලන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

උචිත පර්යේෂණ හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණ සකස් කිරීම UCSC හි අනෙකුත් මූලෝපායකි. වසර අවසානය වන විට අධ්‍යායන වර්ෂය අවසන් කර නොතිබුණු බැවින් අවසන් වසර සිසුන් සඳහා වූ වාර්ෂික UCSC පර්යේෂණ පරිසංවාදය සංවිධානය කිරීම ඊළඟ වසර දක්වා කල්දැමීමට සිදු විය. කෙසේවුව ද කාර්යමණ්ඩල පරිසංවාදය 2013 ජනවාරි මස 29වැනි දින සංවිධානය කරන ලදී. UCSC සිය ICTer ජර්නලයේ කලාප දෙකක් ප්‍රකාශයට පත් කරන ලදී. නැඟී එන කලාපය සඳහා වූ ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණ සම්මන්ත්‍රණය 2013 දෙසැම්බර් මස 11 - 14 දක්වා ඉතා සාර්ථකව පැවැත්වූ අතර පූර්ව සහ පශ්චාත් සම්මන්ත්‍රණ වැඩමුළු එයට ඇතුළත් විය. එමෙන්ම පර්යේෂණ සඳහා අධ්‍යායන කාර්ය මණ්ඩලයේ මැදිහත්වීම තවදුරටත් වැඩි කිරීම පිණිස UCSC විසින් පර්යේෂණ අරමුදල් උපයෝජනය කර ගැනීම සඳහා වූ යාන්ත්‍රණය සංශෝධනය කිරීම ද සිදු කරන ලදී. තවද 2013 දෙසැම්බර් මස 1වැනි දින පැවති IEEE Student, GOLD, WIE congress සඳහා UCSC විසින් සත්කාරකත්වය දක්වන ලදී.

මහාචාර්ය වී. කේ. සමරනායක වාර්ෂික දේශනය 2013 ජුනි මස 10වැනි දින UCSC හි දී ඉතා සාර්ථකව පවත්වන ලදී. ජෛව රසායන විද්‍යාව පිළිබඳ ගරු මහාචාර්යවරයෙක් සහ ජාතික පර්යේෂණ කවුන්සිලයේ සභාපති වන විද්‍යා ජෝති මහාචාර්ය එරික් කරුණානායක මහතා "අධ්‍යායන ජීවිතයේ බාධක හා ජයග්‍රහණ" යන මැයෙන් වූ දේශනයක් පවත්වන ලදී. මහාචාර්ය අභය ඉඳුරුව මහතා මහාචාර්ය වී. කේ. සමරනායක පරිත්‍යාග අරමුදල යටතේ පළමු පරිත්‍යාග සභාපතිවරයා ලෙස පත් කරන ලදී. ඔහු 2014 ජූලිවලදී ඔහුගේ පළමු සංචාරය අරඹනු ඇත. සම්මන්ත්‍රණ, සමුළු සහ වැඩමුළු පිළිබඳ විස්තර වගුව 14 හි දැක්වේ.

වගුව 14: සම්මන්ත්‍රණ, සමුළු සහ වැඩමුළු

| විෂයය | සහභාගි වූ | පළකළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ විද්වතුන්ගේ දේශීය සම්මන්ත්‍රණය | 20 | 3 | 0 |
| ජ්‍යෙෂ්ඨ විද්වතුන්ගේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | 19 | 55 | 20 |

| | | | |
|---|---|---|---|
| සංවිධානය කළ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICTer) | 222 | 55 | 48 |
| ICTer සඟරාව | 5 | 5 | - |
| එකතුව | **266** | **118** | **68** |

ලද සම්මාන

UCSC විසින් ජාතික සහ ජාත්‍යන්තර තරඟවලට සහභාගීවීම සඳහා සිය ශිෂ්‍යයන්ට අඛණ්ඩව දිරිමත් කරන ලදී. ජයග්‍රහණ අත්කර ගත් ශිෂ්‍යයන්ගේ විස්තර ශිෂ්‍ය ජයග්‍රහණ යටතේ ලැයිස්තුගත කර ඇත. එමෙන්ම UCSC විසින් කාර්ය මණ්ඩල පර්යේෂණ නිපැයුම් ද දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් තරඟ කිරීමට දිරිමත් කරවයි. පර්යේෂණ හා සංවර්ධන කාණ්ඩය යටතේ ජයග්‍රහණ අත්කර ගත් SIYARA - වරාය VTMS (වරාය තදබදය කළමනාකරණය පිළිබඳවා නව මානය) ජාතික විශිෂ්ට තත්ත්ව තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්මාන උළලේ දී (NBASQ) වාණිජ අංශයෙන් සහභාගී වූ තොරතුරු තාක්ෂණ නිෂ්පාදන 46ක් පරාජය කරමින් සමස්ත රන් සම්මානය දිනා ගැනීමට සමත්විය. මහාචාර්ය කොඩිකාර විසින් මෙහෙය වන ලද අනුකාරක පර්යේෂණ කණ්ඩායම විසින් මෙම නිෂ්පාදනය සංවර්ධනය කරන ලදී. සිංහල ගීත සඳහා වූ අන්තර්ගතය පදනම් ශ්‍රව්‍ය සංගීත නිරීක්ෂණ ප්‍රවේශය නම් වූ තවත් කාර්යමණ්ඩල ව්‍යාපෘතියක් එම උළෙලේදීම පර්යේෂණ හා සංවර්ධන කාණ්ඩය යටතේ කුසලතා සම්මානයක් දිනා ගැනීමට සමත් විය. මෙයට අමතරව කාර්යමණ්ඩලයේ ඇතැම් පිරිස් සිය පර්යේෂණ කර ගෙනයාම සඳහා ප්‍රදාන දිනා ගන්නා ලදී. සම්මාන ලැබීම පිළිබඳ දත්ත වගුව 15 හි දැක්වේ.

වගුව 15: පර්යේෂණ සම්මාන

| විෂයය | සම්මාන සංඛ්‍යාව | අධ්‍යාපනඥයන් සංඛ්‍යාව | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| දේශීය සම්මාන | 1 | 1 | - |
| ජාතික සම්මාන | 20 | 9 | 53 |
| ජාත්‍යන්තර සම්මාන | 1 | 1 | - |
| වෙනත් | - | - | - |
| එකතුව | **22** | **11** | **53** |

## අධ්‍යයන කාර්ය මණ්ඩලය

කථිකාචාර්යවරු තිදෙනෙක් අනුසප්තාබද්ධ නිවාඩු ලැබූහ. කථිකාචාර්යවරුන් (පරිවාස) සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු බඳවා ගැනීම වසර තුළ දී සිදු කළ අතර මේ සඳහා වූ අනුමැතිය ලබා ගැනීමට නියමිතය. කෙසේ වුවද හිස් වී ඇති තනතුරු සඳහා අවශ්‍ය පුද්ගලයින් බඳවා ගැනීමට UCSC අසමත් විය. අධ්‍යයන සහ අධ්‍යයන සහායක තනතුරු 82 කින් 36 ක් පමණක් සම්පූර්ණ කෙරිණි. පෞද්ගලික ක්ෂේත්‍රයේ ඉතා හොඳ අපේක්ෂාවන් ඇති බැවින් තාක්ෂණික පුහුණුව ලැබූවන් රඳවා ගැනීම සහ හොඳ තරුණ ශාස්ත්‍රඥයින් ආකර්ෂණය කර ගැනීම අතිශයින් දුෂ්කරය. ස්ථිර කාර්ය මණ්ඩලය දවසේ වැඩකටයුතු කරගෙන යන අතරතුර UCSC ඔවුන්ගේ ඇතැම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී බාහිර කාර්ය මණ්ඩලය කෙරෙහි විශ්වාසය තබයි.

ජාත්‍යන්තර මට්ටමේ මානව සම්පත් ආකර්ෂණය කර ගැනීම පිණිස ඕස්ට්‍රේලියාව, ස්වීඩනය, එක්සත් රාජධානිය සහ ඇ.එ.ජ. බාහිර පර්යේෂකයින් කෙටිකාලීනව මෙම වසර තුළ ගෙන්වාගෙන ඇත. UCSC විසින් කාර්යමණ්ඩල හුවමාරු වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් ස්වීඩනයේ උමියා විශ්ව විද්‍යාලයේ Linuaeus Palme ව්‍යාපෘතිය යටතේ සිදු කළ අතර UCSC කාර්යමණ්ඩල සාමාජිකයෙක් සාර්ථකව උමියා විශ්ව විද්‍යාලය තුළ පාඨමාලාවක් මෙහෙය වූයේය.

අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ දත්ත වගුව 16 හි දැක්වේ.

වගුව 16: කාර්යමණ්ඩල පර්යේෂණ ක්ෂේත්‍ර

| විෂයයන් | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | සහාය කථිකාචාර්ය | උපදේශක |
|---|---|---|---|---|---|---|---|
| පරිගණකකරණය (P) | ඉංග්‍රීසි | - | 02 | 19 | 13 | - | 02 |
| පරිගණකකරණය (C) | ඉංග්‍රීසි | - | - | - | - | 07 | 08 |

*04 නිවාඩු මත

## අනධ්‍යයන කාර්ය මණ්ඩලය: ස්ථිර (P) කොන්ත්‍රාත්/පැවරුම් (C/A)

කළමනාකරණ හා උපායමාර්ගික තොරතුරු පද්ධතියක් දියුණු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට ප්‍රයත්නය දරනු ලැබිය. භව්‍ය පරිශීලකයන්ගේ අඩු සම්බන්ධවීම නිසා ප්‍රතිඵලය දිරිගන්වන සුළු නොවීය. වැඩසටහන් සම්පාදක සහ පද්ධති විශ්ලේෂක යන ධූරය පුරප්පාඩු වූ බැවින් කර ගෙන යන විභාග පිරිසැකසුම් පද්ධති වැඩ ක්‍රියාත්මක කිරීම නවතා දමන ලදී. බාහිර සහ ව්‍යාප්ති වැඩසටහන් හා පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා මාර්ගගතව ගෙවීමේ පහසුකම හඳුන්වා දෙන ලදී. UCSC හි මූල්‍ය පද්ධතිය උත්ශ්‍රේණි කළ අතර අවේක්ෂණය සහ තිරසේත්ත පදනම් ප්‍රකාශ කිරීම් නිරීක්ෂණය කිරීමට ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

UCSC හි අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර වගුව 17 හි දැක් වේ. UCSC තුළ අනධ්‍යයන කාර්ය මණ්ඩලය 78 ක සංඛ්‍යාවක් අනුමතවී තිබුණද ස්ථිර පත්වීම් 40 ක් පමණක් පුරවා ඇති අතර බොහෝ වැඩ කොන්ත්‍රාත් සහ පැවරුම් කාර්ය මණ්ඩලය මගින් සිදු කරනු ලබයි. කෙසේ වුවත් වසර තුළදී සාමාන්‍ය පරිපාලනය සඳහා සේවක සංඛ්‍යාව 3 කින් වැඩි කරන ලදී.

වගුව 17: අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| වර්ගය | විධායක ජ්‍යෙෂ්ඨ (පරිපාලන) | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවකයන් | ව්‍යාපෘති කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|
| P | 7 | 2 | 24 | 7 | - |
| C | 1 | 3 | 13 | 12 | 20 |
| A | - | 2 | 6 | 4 | 11 |

## කාර්ය මණ්ඩල පුහුණුව සහ විදේශීය නිවාඩු

පුහුණු නිවාඩු: අධ්‍යයන කාර්යමණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙක් විදේශවල පැවති පුහුණු වැඩසටහන්වලට සහභාගී වූහ.

බීඑම්ජ්වී මාපා මහතා (ඉන්දියාව) හා එස්සීඑම්බී අත්තනායක මහතා (බංගලාදේශය).

අධ්‍යයන කාර්යමණ්ඩලයේ සාමාජිකයින් පහළොවක් සංචාර 22 ක් ඇතුළත් වූ විදේශ සම්මන්ත්‍රණවලට සහභාගී වූහ.

එම්ජීඑන්ඒඑස් ප්‍රනාන්දු මහතා (තායිලන්තයට දෙවරක් සහ ඉන්දුනීසියාවට), ආචාර්ය ජීඩීඑස්පී විමලරත්න මහතා (තායිලන්තය), ආචාර්ය කේපී හේවාගමගේ (පෘතුගාලය, බාසිලෝනාව හා ස්වීඩනය), ආචාර්ය කේඑල් ජයරත්න (සිංගප්පූරුව), ආචාර්ය එච්ජ් කල්දේරා (දකුණු කොරියාව), මහා. ජීඑන් වික්‍රමනායක (අයිස්ලන්තය හා හොංකොං), ආචාර්ය ඒආර් වීරසිංහ (පෘතුගාලය හා ස්වීඩනය), ආචාර්ය එම්ඩීජේඑස් ගුණතිලක මිය (වියට්නාමය හා ඉන්දියාව), ආචාර්ය ඒටී ධර්මරත්න මිය (ඉන්දුනීසියාව), මහා. එන්ඩී කොඩිකාර (සිංගප්පූරුව), ආචාර්ය ටීඑන්කේ ද සොයිසා (ඉන්දියාව), එම්ඩීඑන්ආර් දයාරත්න මහතා (ඉතාලිය), ටීජ් වීරසිංහ මිය (චීනය), ආචාර්ය ඩීඑන් රණසිංහ (ඉන්දියාව) සහ ආචාර්ය ඩීජ්එස් අතුකෝරළ (සිංගප්පූරුව)

අධ්‍යයන කාර්යමණ්ඩලයේ තිදෙනෙක් අනුසප්තාබ්දක නිවාඩු ලැබූහ.

ආචාර්ය සීඅයි කැප්පෙටියගම (ස්වීඩනය), ආචාර්ය එම්සී ජයවර්ධන (ඔස්ට්‍රේලියාව) සහ ආචාර්ය එච්එල් ප්‍රේමරත්න (ඔස්ට්‍රේලියාව)

අධ්‍යයන කාර්යමණ්ඩලයේ දෙදෙනෙක් අධ්‍යයන නිවාඩු ලැබූ අතර ඔවුන් අතුරින් එක් අයෙක් පසුව රාජකාරී භාර ගත්තේය. අධ්‍යයන කාර්යමණ්ඩලයේ හතරදෙනෙක් තවදුරටත් අධ්‍යයන නිවාඩු ලැබූහ.

රාජකාරි භාර ගත්: එච්ඒඑම්එච්බී ඒකනායක මයා (ස්වීඩනය) 05/02 දින සහ ටීඒ වීරසිංහ මිය (ස්වීඩනය) 08/08 දින.
තවදුරටත් කර ගෙන ගිය අය: එච්එම් සිරිවර්ධන මහතා (ජපානය), එල්එන්සී ද සිල්වා මිය (ශ්‍රී ලංකාව), එෆ්එච්ඒඑම් ප්‍රේමචන්ද්‍ර මිය (ඔස්ට්‍රේලියාව), එම්අයිඊ වික්‍රමසිංහ මහතා (මැලේසියාව)

වෙනත්: කාර්යමණ්ඩලයේ 57දෙනෙක් තායිලන්තයේ කළ විදේශ සුභසාධන විනෝද චාරිකාවට සහභාගී වූහ. කාර්යමණ්ඩලයේ සාමාජිකයින් හතර දෙනෙක් පුද්ගලික සංචාර 6ක් සඳහා සහභාගී වූහ.
එස්එස්පී මාතර ආරච්චි මහතා (මැලේසියාව), කේඑස් ගුණතිලක මහතා (තායිලන්තයට දෙවරක් හා ඉන්දියාව), එම්බීආර්එන් දයාරත්න මහතා (ස්වීඩනය), ආචාර්ය කේඑල් ජයරත්න (ඔස්ට්‍රේලියාව)

**කාර්ය මණ්ඩල සුභසාධනය**

**රක්ෂණ යෝජනාක්‍රමය**

2013 වර්ෂය තුළ UCSC හි සේවකයින්ගේ ප්‍රතිලාභය පිණිස රක්ෂණ යෝජනාක්‍රමයක් හඳුන්වා දෙන ලදී. පහසුකම් රාශියක් ඇති මෙම රක්ෂණ යෝජනාක්‍රමය යුනියන් ඇෂුවරන්ස් සමාගම විසින් පිරිනමන ලද අතර සේවකයින් 51ක් දෙනෙක් පමණ මෙම රක්ෂණ යෝජනාක්‍රමයට දායක වී තිබිණි.

**වාර්ෂික විනෝද චාරිකාව**

UCSC සුභසාධක සංගමය විසින් 2013 වර්ෂය තුළ එහි කාර්යමණ්ඩලයට තායිලන්තයේ විදේශ සංචාරයක් සඳහා සහභාගීවීමට හෝ ගිරිතලේ වෙත ගිය දේශීය සංචාරයක් සඳහා සහභාගීවීමේ අවස්ථාව උදා කර දෙන ලදී. මෙයට අමතරව, UCSC සුභසාධක සංගමය විසින් වර්ෂ අවසාන එකට එක් වීමේ උත්සවයක් සහ ක්‍රීඩා දිනයක් දෙසැම්බර් මස 22වැනි දින සංවිධානය කරන ලදී.

ආචාර්ය එච් ඒ කල්දේරා 2013 පෙබරවාරි මස 15වැනි දින පැවැත්වූ 2012 දිප ව්‍යාප්ත අන්තර් විශ්වවිද්‍යාල මේස පන්දු තරඟාවලියේ දී පිරිමි කේවල තරඟ ශූරතාවය දිනා ගන්නා ලදී.

## මූල්‍යය

### පුනරාවර්තන වියදම්

භාණ්ඩාගාර අරමුදල් උපාධි අපේක්ෂක ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් UCSC උත්පාදිත ආදායම එදිනෙදා මෙහෙයුම් සඳහා දායක කොට ගනී. උපාධි අපේක්ෂක ශිෂ්‍යයකු වෙනුවෙන් වියදම රු. 152,000 කි. UCSC විසින් උපාධි අපේක්ෂක පුනරාවර්තන වියදමින් 32%ක් වන රුපි. මිලියන 43ක් අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන සඳහා දායක කරන ලදී. පුද්ගල වේතනවල වැඩිවීම හැරුණු කොට රජයේ වෙන් කිරීම් පසුගිය වසරට වඩා අඩු විය. පුනරාවර්තන වියදම්වල බෙදා දැක්වීම 18 වගුවෙහි දී ඇත.

වගුව 18: පුනරාවර්තන වියදම — රු. 000'

| විෂයය | 2012 | 2013 |
|---|---|---|
| පුද්ගල වේතන | 92,840 | 108,057 |
| ගමන් වියදම් | 528 | 1,560 |
| සැපයුම් | 4,579 | 6,087 |
| නඩත්තු | 3,057 | 3,445 |
| කොන්ත්‍රාත්තුමය සේවා | 29,701 | 35,165 |
| වෙනත් | 57,357 | 67,574 |
| එකතුව | 188,062 | 221,888 |
| රජයේ ප්‍රතිපාදන | 91,802 | 90,383 |

ප්‍රාග්ධන වියදම්

UCSC එහි පරිගණක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා භෞතික සම්පත්වල ආයෝජනය කර ඇත. පරිගණක විද්‍යාගාර කිහිපයක් නවීන උපකරණවලින් සමන්විත බවට පත් කරන ලදී. කැම්බියෝ ආයතනය විසින් රු. මිලියන 5 ක් වටිනා පරිගණක විද්‍යාගාරයක් ප්‍රදානය කරන ලදී. UCSC විසින් ඔවුන්ගේ වත්කම්වල වාර්තා තබා ගැනීමට තිරසේත්‍ර පද්ධතියක් ස්ථාපනය කරන ලදී. ජාල මෙහෙයුම් මධ්‍යස්ථානයේ උපකරණ ඉහළ තැරුම් ආදානයක් සඳහා උත්ශ්‍රේණි කරනු ලැබීය. ප්‍රාග්ධන වියදම්වල තොරතුරු වගුව 19 හි දී ඇත.

වගුව 19: ප්‍රාග්ධන වියදම — රු. 000'

| විෂයය | 2012 | 2013 |
|---|---|---|
| ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ අත්පත් කරගැනීම් | 14,604 | 13,954 |
| යන්ත්‍රෝපකරණ අත්පත් කරගැනීම් | - | - |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් අත්පත් කරගැනීම් | 22,327 | 43,412 |
| වෙනත් | 4,076 | 17,449 |
| එකතුව | **41,007** | **74,815** |
| රජයේ ප්‍රතිපාදන | 19,150 | 25,759 |

ව්‍යාපෘති (දේශීය/විදේශීය අරමුදල් සැපයූ)

UCSC සතුව විෂයයන් ගණනාවක ප්‍රබල පර්යේෂණ කණ්ඩායමක් ඇත. ඒවා අතුරින් ආදර්ශනය හා අනුකරණනය, ඊ-ඉගෙනුම හා භාෂා තාක්ෂණය යනාදිය පරිශීලක සමාජයට ලඟා වී ඇත. UCSC ශක්තිමත් කාර්මික විශ්ව විද්‍යාලයීය සහයෝගීතාවයක් මෙන්ම සහයෝගාත්මක අන්තර් ශික්ෂණයකින් යුතු පර්යේෂණ සංස්කෘතියක් ද ගොඩනංවා ඇත.

පර්යේෂණ පාදක කරගත් ව්‍යාපෘතිවලට අමතරව UCSC රාජ්‍ය හා පෞද්ගලික අංශවලට උපදේශක සේවාවන් ද සපයයි. පෙරදී කරන ලද වැඩ පිළිබඳව UCSC හට මනා ප්‍රසිද්ධියක් ඇත. 1981 සිට ජාතික මැතිවරණවලට සහාය දක්වා ඇත. UCSC හි මෘදුකාංගයක් භාවිතයෙන් දැන් උපත්, විවාහ සහතික එසැණින් නිකුත් කරනු ලබයි. සිංහල යුනිකෝඩ් සැලසුම්කර හා දියුණු කිරීමේ UCSC උත්සාහයන් නිසා නවීන පරිගණක සිංහල භාෂාවට සහාය දක්වයි.

විශ්ව විද්‍යාලය ප්‍රතිපාදන කොමිසම සඳහා විශ්වවිද්‍යාලය ශිෂ්‍යයන් තෝරා ගැනීමේ සහ වෙන්කිරීමේ පද්ධතියේ ක්‍රියාත්මක කිරීම UCSC විසින් කරන ලද ප්‍රධාන සංවර්ධන ක්‍රියාකාරකම්වලින් එකකි. මෙය සැලකිය යුතු මට්ටමින් විශ්වවිද්‍යාල අතුළත් කර ගැනීම් සඳහා ගතවන කාලය අවම කරන්නා සේම ක්‍රියාවලියේ නිවැරදි බවද තහවුරු කරයි. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමට හා අනෙකුත් විශ්වවිද්‍යාල ගණනාවක් සඳහා ඊ-පරීක්ෂණ පදනම් කොටගත් බඳවාගැනීම් ඊ-ඉගෙනුම් මධ්‍යස්ථානය හරහා සිදු කෙරේ. උසාවි නඩුවලට සහාය වීමට අංකිත අධිකරණ විද්‍යා ක්‍රියාකාරකම් සිදු කිරීමද UCSC විසින් අඛණ්ඩව කරගෙන යයි.

උනන්දුවක් දක්වන ප්‍රධාන පාර්ශ්ව සමග උපායමාර්ගික සම්බන්ධතා පවත්වා ගන්නා අතරම රටේ ඊ-රාජ්‍ය ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සහ රජයේ අමාත්‍යාංශ සහ HETC සමග නව ව්‍යාපෘති ආරම්භ කිරීම නොකඩවා කරගෙන යයි. තීක්ෂණ යනු, ශුන්‍ය ශේෂයකින් අරඹා දැන් රුපියල් මිලියන 9 ක් පමණ වන සංචිත ඇති UCSC හට අයත් සමාගමකි.. UCSC විසින් සිදුකළ පර්යේෂණ ව්‍යාපෘතිවල විස්තර සහ ඒවයේ වියදම වගුව 20 සහ 21 හි ලැයිස්තුගත කර ඇත.

**තීක්ෂණ**

නව විදේශ අරමුදල් හිමි වූ ව්‍යාපෘතිවලින් ලද ආදායම අඩු වුව ද තීක්ෂණ සඳහා දේශීය ප්‍රජාවේ උනන්දුව කැපීපෙනෙන ලෙස වර්ධනය විය. පසුගිය වසරේ දී සාමාජිකත්වයේ සහ තීක්ෂණ ව්‍යාපෘතිය සඳහා ඔවුන්ගේ දායකත්වයේ විශාල වැඩිවීමක් දක්නට ලැබුණ ද මූල්‍ය වර්ෂයේ පළමු අර්ධයේ දී මාස දෙකක් පැවති විශ්වවිද්‍යාල අධ්‍යයන වැඩවර්ජනය හේතුවෙන් ව්‍යාපාර අවස්ථා අහිමිවීමක් සිදු විය. අධ්‍යයන දිනදර්ශනය වෙනස්වීම සහ අතිරේක ශිෂ්‍ය බඳවා ගැනීම් සමග අතපසුවූ අධ්‍යයන කටයුතු නිම කිරීම සඳහා අපගේ මානව සම්පත් ලබා ගැනීමේ

හැකියාව සීමිත විය. මෙයට අමතරව තීක්ෂණ ව්‍යාපෘතියේ සාර්ථක ව්‍යාපෘති කීපයක්ම අනෙක් ආයතන විසින් අත්කර ගැනීමක් සිදු විය. තීක්ෂණ ව්‍යාපෘතිය යටතේ මීට පෙර සිදු කළ සියලු විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයින්ගේ තොරතුරු තාක්ෂණ නිපුණතා ඇගයීමේ කාර්යය සේවාලාභියා විසින් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනයේ (UCSC) තනි පුද්ගලයින්ට ලබා දෙන ලදී. වරලත් ගණකාධිකාරවරුන්ගේ විභාග පරීක්ෂණ ස්වයංක්‍රීය කිරීම සඳහා වූ තීක්ෂණ විසඳුම පවා වර්තමානයේ දී UCSC ඊ-ඉගෙනුම් කේන්ද්‍රය විසින් සිදු කරනු ලැබේ.

කෙසේවුව ද තීක්ෂණ ව්‍යාපාතිය පිළිබඳව වාර්තා කිරීමට සාර්ථක අවස්ථා කීපයක්ම ඇත. ශ්‍රී ලංකා පොලීසිය සඳහා ස්වයංක්‍රීය ඇඟිලි සලකුණු හඳුනා ගැනීමේ පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලද අතර නව ව්‍යාපෘති කීපයක්ම ICTA විසින් පිරිනැමීම තීක්ෂණ ව්‍යාපෘතියේ සේවාවල ගුණාත්මකභාවයට සහ විශ්වසනීයත්වයට සාධක වේ. දේශීය භාෂා ආශ්‍රිත ව්‍යාපෘති කීපයක්ම නව ICTA ව්‍යාපෘති අතර වේ. එමෙන්ම වසර තුළ දී තීක්ෂණ හරහා ජාතික සමීක්ෂණ කවුන්සිලය මගින් ප්‍රදානය කරනු ලබන පර්යේෂණ ප්‍රදාන කීපයක්ම ලබාදීම ද සිදු විය. රට පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පිහිටුවන ලද උපත්, විවාහ සහ මරණ සහතික නිකුත් කිරීමේ පද්ධතිය තීක්ෂණ හරහා ඉතා සාර්ථකව පවත්වාගෙන යන ලදී. භූතාන රාජකීය විශ්වවිද්‍යාලය සඳහා වූ ඊ-ඉගෙනුම් විසඳුම සාර්ථකව ක්‍රියාත්මකවීමේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ කාර්යමණ්ඩලය සඳහා භූතානයේ දී කෙටි කාලීන පුහුණු වැඩසටහනක් පැවැත්විණි.

### ප්‍රදර්ශන

නොවැම්බර් 13 සිට 17 දක්වා කොළඹ දී පැවති CHOGM වෙළඳ ප්‍රදර්ශනයට UCSC සහභාගී විය. එමෙන්ම ICIT වැඩසටහන සහ ශිෂ්‍ය ව්‍යාපෘති කීපයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ඔක්තෝබර් මස 24 සිට 27 දක්වා පැවති Infotel ප්‍රදර්ශනය සඳහා ද UCSC සහභාගී විය. මහාචාර්ය ගිහාන් සමරනායක මහතාව මෙම අවස්ථාව සඳහා අධ්‍යාපනය සම්බන්ධ සන්නම් තානාපති ලෙස තෝරා ගන්නා ලදී.

වගුව 20: පුනරාවර්තන වියදම

රු. 000'

| නාම සහ විස්තර | ප්‍රදානය | අරමුදල්කරණ නියෝජිතායතනය | TCE | RFA | DF |
|---|---|---|---|---|---|
| M-ATM (2010-11) | 7,596 | තාක්ෂණය පිළිබඳ රාජකීය අධ්‍යායනායතනය (KTH), ස්වීඩනය | | | |
| ටෙලිසෙන්ටර් ආයතනය (2010-11) | 2,856 | ටෙලිසෙන්ටර් ආයතනය, පිලිපීනය | | | |
| විදේශීය අරමුදල් | **10,452** | | | | |
| FASS (2011-2012) | 1,308 | ආරක්ෂක අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව | | | |
| කොප්සයුර (2011-13) | 1,934 | ජාතික විද්‍යා පදනම | | | |
| ආහාර ආරක්ෂාව -2012 | 2,808 | ජාතික විද්‍යා පදනම | | | |
| දේශීය අරමුදල් | **6,050** | | | | |

TCE – ඇස්තමේන්තුගත මුළු පිරිවැය; RFA – අයදුම් පත්‍රය සඳහා ඉල්ලීම; DF – වට්ටම් සාධකය

### ව්‍යාපෘති වියදම (දේශීය/විදේශීය අරමුදල් සැපයූ)

වගුව 21: ව්‍යාපෘති වියදම

රු. 000'

| නාම | TCE ඉ/ගෙ නිවැරදි පිරිවැය | 2012 දී වියදම | 2013 දී වියදම | 2012.12.31 දිනට සමුච්චිත වියදම | භෞතික ප්‍රගතියේ % |
|---|---|---|---|---|---|
| M-ATM | 5,665 | 697 | 917 | 7,279 | 84% |
| ටෙලිසෙන්ටර් ආයතනය | 2,390 | 168 | 168 | 2,726 | 100% |
| විදේශීය ව්‍යාපෘති වියදම | **8,055** | **865** | **1,085** | **10,005** | |
| FASS | 40 | 970 | 458 | 1,468 | 77% |
| NSF | - | 1,709 | 608 | 2,317 | 88% |
| ආහාර ආරක්ෂාව -2012 | - | - | 1,704 | 1,704 | 25% |
| දේශීය ව්‍යාපෘති වියදම | **40** | **2,679** | **2,770** | **5,489** | |

මූල්‍ය ප්‍රගතිය (වියදම්)

වගුව 22: මූල්‍ය ප්‍රගතිය (වියදම්) රු. 000'

| විෂයය | ප්‍රතිපාදනය | වියදම | ඉතුරුම්/අතිරික්තය |
|---|---|---|---|
| ව්‍යාපෘති හැර පුනරාවර්තන | 239,426 | 221,888 | 17,538 |
| ව්‍යාපෘති හැර ප්‍රාග්ධනය | 57,250 | 74,815 | (17,565) |
| ව්‍යාපෘති - දේශීය අරමුදල් සැපයූ | 2,770 | 2,770 | - |
| ව්‍යාපෘති – විදේශීය අරමුදල් සැපයූ | 1,085 | 1,085 | - |
| එකතුව | **300,531** | **300,558** | **(27)** |

මූල්‍ය ප්‍රගතිය (උත්පාදනය කළ ආදායම)

වගුව 23: මූල්‍ය ප්‍රගතිය (උපයාගත් ආදායම්) රු. 000'


| ආදායම් මූලාශ්‍රය | ප්‍රතිපාදනය | රැස් කිරීම | ඌනතාවය / අතිරික්තය |
|---|---|---|---|
| උපාධි අපේක්ෂක අධ්‍යයන | 91,910 | 93,994 | 2,084 |
| පශ්චාත් උපාධි අධ්‍යයන | 45,700 | 51,963 | 6,263 |
| උපදේශන | 14,000 | 11,193 | (2,807) |
| බාහිර උපාධි | 68,394 | 78,708 | 10,314 |
| වෙනත් | 68,143 | 74,357 | 6,214 |
| එකතුව | **288,147** | **310,215** | **22,068** |

උපාධි අපේක්ෂකයන්ගේ ආදායම හැර UCSC විසින් 242,025 ක උත්පාදිත ආදායමක් උපයන ලදී. UCSC හි උත්පාදනය කළ ආදායම එහි ප්‍රධාන විශ්වවිද්‍යාලය ඇතුළු බොහෝ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවලට වඩා ඉතා ඉහළ විය.

මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

වගුව 24: මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය රුපි. 000'

| විෂයය | සූත්‍රය | එක් ශිෂ්‍යයෙක් සඳහා වියදම |
|---|---|---|
| එක් ශිෂ්‍යයෙක් සඳහා පුනරාවර්තන වියදම (RE) | RE / ශිෂ්‍ය බලයේ සංඛ්‍යාව | 152 |
| ශිෂ්‍යයෙක් සඳහා ප්‍රාග්ධන වියදම (CE) | CE / ශිෂ්‍ය බලයේ සංඛ්‍යාව | 81 |
| එකතුව | | **233** |




රූප සටහන 2: උත්පාදිත ආදායම

## 2013 දී ලද යටිතල පහසුකම්

සීමිත ඉඩක ක්‍රියා කරන UCSC සඳහා දේශන පැවැත්වීමටද ප්‍රමාණවත් ඉඩක් නැත. ශිෂ්‍යයන් සඳහා ප්‍රමාණවත් ඉඩක් භෝජනාගාරය, පොදු සහ ඉගෙනුම් කාමර තුළ නැත. විශ්වවිද්‍යාලයට බිමක් ලබා දීමට නොහැකි බැවින් UCSC බටහිර අංගනය සහ හතරවන මහල ව්‍යාප්ත කොට ගොඩනැගීම ආරම්භ කළේ උපාධි අපේක්ෂකයින් පන්ති කාමරවල අඩුව සම්පූර්ණ කිරීමට සහ පූර්ණ කාලීන පර්යේෂණ සිසුන්ගේ නවාතැන් සඳහාය. මෙම ව්‍යාපෘතිය 2011 දී ඇරඹි අතර මාස කිහිපයක ඉදි කිරීම් පමාවීම්වලින් පසුව 2013 ජූනි 13 වන දින භාර දෙන ලදී.

කෙටිකාලීන යටිතල පහසුකම්වල අවශ්‍යතාවයට මුහුණදෙන අතර පුළුල් කිරීමේ සැලසුම් මධ්‍ය හා දිගු කාලීන අරමුණුවලට මුහුණ දෙන අයුරින් සැලසුම් කරන ලදී. දැනට භෝජනාගාරය පවතින ස්ථානයේ භෝජනාගාරයක් හා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදි කිරීම සමගින් දේශන ශාලා/අධ්‍යයන කාමර මගින් දැනට පවතින ශ්‍රවණාගාරය ප්‍රතිස්ථාපනය කිරීම මධ්‍යකාලීන අරමුණු අතර වේ. දිගුකාලීන අරමුණු ලෙස කොළඹ විශ්වවිද්‍යාලයට පිටතින් ගොඩනැගිලි ඉදි කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනිණි. ආපනශාලා සහ පරිපාලන ගොඩනැගිල්ලේ ආපනශාලා කොටස අදියර I ලෙස හඳුනා ගත් අතර ඔක්තෝබර් මස 31වැනි දින මුල් ගල තැබීමත් සමග 2013 දී ඉදි කිරීමේ වැඩ ආරම්භ කරන ලදී. මෙම වැඩකටයුතු 2014 සැප්තැම්බර් මාසයේ දී අවසන් කිරීමට අපේක්ෂා කරනු ලැබේ. වසර අවසානය වන විට අත්තිවාරම දක්වා වූ ඉදිකිරීම් සම්පූර්ණ කරන ලදී. ඉදි කිරීම් වැඩවල විස්තර 25 වන වගුවෙහි දැක්වේ.

රු. 000'

වගුව 25: යටිතල පහසුකම්

| යටිතල පහසුකම් විස්තර | වියදම් (රු) | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| UCSC ගොඩනැගිල්ල පුළුල් කිරීම | 60,628 | 100% |
| භෝජනාගාරය සහ පරිපාලන ගොඩනැගිල්ල අදියර I | 20,533 | 30% |

## වෙනත් යම් තොරතුරු/ මෙම වාර්තාවට අදාළ කාර්යසාධනය

දේශීය හා ජාත්‍යන්තර දෘශ්‍යතාව වැඩි කිරීම සඳහා UCSC හි ක්‍රියාකාරකම්වල මුද්‍රණ මාධ්‍ය ආවරණය, සහභාගිත්වය වැඩිදියුණු කිරීමට UCSC හි වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය සමගින් පවත්වා ගන්නා ලදී.

තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සහ නිෂ්පාදනය පර්යන්තය වෙත ගෙන යාම සිය සමාජයීය වගකීම් වලින් එකක්

ලෙස UCSC සලකයි. වසර තුළදී උසස් පෙළ සිසුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් හඳුන්වා දීමට UCSC රූපවාහිනී සංස්ථාව සමග හවුල් විය. සෑම බදාදා උදෑසනකම 9 සිට 10 දක්වා විකාශ වන SLBC රේඩියෝ වැඩසටහන හරහා ප්‍රජා අතුරු මුහුණතක් වීම ද UCSC අඛණ්ඩව කරගෙන යයි. ජාත්‍යන්තර ඔලිම්පියාඩ් තරඟය (International

Olympiad in Informatics IOI) - ඇතුළු මෘදුකාංග තරඟමාලා පැවැත්වීම සඳහා ද UCSC සිය සහාය අධ්‍යාපන අමාත්‍යාංශයට සහ පාසල්වලට ලබා දේ. ජුලි මස 6 සිට 13 දක්වා ඔස්ට්‍රේලියාවේ දී පැවති IOI'13 සඳහා සහභාගීවීම පිණිස සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත IOI කණ්ඩායමක් නායකයා සහ නියෝජ්‍ය නායකයා සමගින් තෝරා ගන්නා ලද අතර මේ සඳහා UCSC සහාය දැක්වීය. එමෙන්ම මැයි මස 11වැනි දින පැවති ආසියා පැසිෆික් ඉන්ෆොමැටික්ස් ඔලිම්පියාඩ් (APIO) තරඟය සඳහා ද මෙම කණ්ඩායම සහභාගී විය.

සිංගප්පූරුවේ රිපබ්ලික් පොලිටෙක්නික් ආයතනයේ ශිෂ්‍යයන් 24 දෙනෙකු සහ ගුරුවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ජුනි 1වන දින UCSC හි සංචාරය කළහ. ජනවාරි මාසයේ දී කොරියානු කතෝලික විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ජියැන්නිග් (ජොනී) ෂාඕ මහතා අපගේ ශිෂ්‍යයන් සඳහා පශ්චාත්-උපාධි අවස්ථා සොයා බැලීම පිණිස මෙරට සංචාරයක නිරත විය. කොරියාවේ MarkAny සමාගමේ උප-සභාපති ජේ ජේ කිම් මහතා එක් දරුවෙක් සඳහා එක් ලැප්ටොප් පරිගණකයක් යන සංකල්පය අනුව යමින් පාසැල් සඳහා සහයෝගීතා ඊ-ඉගෙනුම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව සොයා බැලීම පිණිස ජනවාරි මාසයේ දී සංචාරයක් සිදු කළේය. එඩින්බර්ග් විශ්වවිද්‍යාලයේ ආචාර්ය ජෙෆ් ග්‍රෙග්සන් මහතා විසින් 2013 පෙබරවාරි මස 19වැනි දින ශිෂ්‍යයන් සහ කාර්යමණ්ඩලය සඳහා බුද්ධිමය දේපළ පිළිබඳ දේශනයක් පවත්වන ලදී. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ කෙටි සංවර්ධන සැලසුම් සාකච්ඡා කිරීම සඳහා සහ එහි ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ජනාධිපතිතුමා සමග රැස්වීමක් මාර්තු මස 1වැනි දින UGC හිදී පවත්වන ලදී. නම් වශයෙන් BIT සහ වාණිජකරණය යන UCSC ව්‍යාපෘති දෙක ඇතුළත් මධ්‍ය-ව්‍යාපෘති සමාලෝචනයක් සඳහා ලෝක බැංකුවේ කණ්ඩායමක් මැයි මස 28වැනි දින කොළඹ විශ්වවිද්‍යාලයේ සංචාරයක නිරත විය. අපගේ අවසන් වසර උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් සඳහා පරිගණක 40කින් සමන්විත විද්‍යාගාරයක් වූ පරිත්‍යාගයක් වන කැම්බියෝ පර්යේෂණ විද්‍යාගාරය BOM, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති යන අයගේ සහභාගීත්වයෙන් මාර්තු මස 25වැනි දින විවෘත කරන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

කොළඹ විශ්වවිද්‍යාලය

2013 දෙසැම්බර් 31 වන දිනට ඒකාබද්ධ ශේෂ පත්‍රය

| | 2013<br>රුපි.<br>ශු.පො.අගය | 2012<br>රුපි.<br>ශු.පො.අගය |
|---|---|---|
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ, පිරියත සහ උපකරණ | - | - |
| ගොඩනැගිලි | 71,371,639 | 12,643,800 |
| විද්‍යාගාර සහ තාක්ෂණික උපකරණ ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 74,846,459 | 60,601,400 |
| පුස්තකාල පොත් සහ වාර සඟරා | 973,843 | 990,690 |
| මෝටර් වාහන | 4,933,664 | 3,774,644 |
| එකතුව | 152,125,605 | 78,010,534 |
| ප්‍රාග්ධන වත්කම්වල පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම | 31,404,754 | 30,413,602 |
| නොනිමි ඉදි කිරීම් වැඩ | 9,775,667 | 37,748,579 |
| ජංගම වත්කම් | | |
| තොග | 3,198,314 | 2,442,445 |
| ලැබිය යුතු දෑ සහ කලින් ගෙවීම් | 88,669,647 | 38,602,043 |
| SIDA අරමුදල් | - | - |
| මුදල් සහ මුදල් සමාන දෑ | 651,587,603 | 581,177,143 |
| මුළු ජංගම වත්කම් | 743,455,564 | 622,221,631 |
| මුළු වත්කම් | 936,761,599 | 768,394,353 |
| හිමිකම් සහ වගකීම් | | |
| ප්‍රාග්ධනය සහ වෙන්කිරීම් | | |
| ප්‍රාග්ධනය | | |
| ප්‍රාග්ධන ප්‍රධාන - වැය නොකළ | 19,451,866 | 4,857,245 |
| වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන | 113,563,832 | 57,564,972 |
| විදේශීය අරමුදල් සැපයූ ව්‍යාපෘති-වැය නොකළ | 2,720,033 | 1,336,470 |
| විදේශීය අරමුදල් සැපයූ අරමුදල්-වැය කළ | 21,334,025 | 30,803,032 |
| විලම්බිත ප්‍රදාන | - | - |
| UoC වෙතින් දායකත්වය | 8,155,714 | 8,155,714 |
| එකතුව | 165,225,470 | 102,717,433 |
| සංචිත | 464,395,995 | 433,117,827 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 3,000,000 | - |
| සීමා කළ අරමුදල් | 70,067,477 | 67,859,485 |
| ජංගම නොවන වගකීම් | | |
| විශ්‍රාම ප්‍රතිලාභ | 31,395,771 | 27,573,818 |
| ජංගම වගකීම් | | |
| වෙනත් උපචිත වියදම් සහ ගෙවිය යුතු දෑ | 202,676,886 | 137,051,170 |
| බැංකු අයිරා | - | 74,620 |
| එකතුව | 202,676,886 | 137,125,790 |
| මුළු හිමිකම් සහ වගකීම් | 936,761,599 | 768,394,353 |

2013.02.28

.......................... ..........................

අධ්‍යක්ෂක(UCSC) නියෝජ්‍ය මුල්‍යාධිකාරි

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

කොළඹ විශ්වවිද්‍යාලය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ඒකාබද්ධ ආදායම් සහ වියදම් ගිණුම

| | 2013 රු.පි. | 2012 රු.පි. |
|---|---|---|
| පශ්චාත් උපාධි වැඩසටහන | | |
| ආදායම | | |
| රාජ්‍ය ප්‍රදාන | 90,383,000 | 91,802,000 |
| විලම්බිත අදායම් - ප්‍රදාන | 14,430,010 | 14,629,135 |
| වෙනත් | 3,610,684 | 2,671,894 |
| | 108,423,694 | 109,103,029 |
| පශ්චාත් උපාධි වැඩසටහන - වියදම් | | |
| පුද්ගල වේතන | 69,371,031 | 60,733,791 |
| ගමන් වියදම් | 623,097 | 37,701 |
| සැපයුම් | 4,573,837 | 2,927,786 |
| කොන්ත්‍රාත්තුමය සේවා | 33,428,209 | 26,818,704 |
| විශ්‍රාම ප්‍රතිලාභ | 16,183,766 | 13,726,350 |
| දායකත්වය, දායකත්වය සහ සාමාජිකත්ව ගාස්තුව | 105,530 | 36,929 |
| සේවක සංවර්ධනය | 19,000 | 106,270 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 9,005,017 | 6,825,057 |
| ක්ෂය | 16,818,989 | 14,629,135 |
| එකතුව | 150,128,476 | 125,841,723 |
| පශ්චාත් උපාධි වැඩසටහනෙන් හිඟය | (41,704,781) | (16,738,694) |
| ව්‍යාප්ත වැඩසටහන | | |
| විද්‍යාපති වැඩසටහන | 44,871,205 | 41,891,163 |
| බාහිර උපාධි මධ්‍යස්ථානය | 54,004,151 | 40,714,205 |
| පරිගණක සේවා මධ්‍යස්ථානය | 4,748,974 | 2,137,334 |
| උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය | 1,054,794 | 827,464 |
| ඊ-ඉගෙනුම් මධ්‍යස්ථානය | 10,384,270 | 18,105,244 |
| වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය | (416,751) | (520,064) |
| ව්‍යාප්ති වැඩසහනෙන් අතිරික්තය | 114,646,643 | 103,155,346 |
| ව්‍යාපෘති | | |
| විදේශ අරමුදල් සැපයු පොදු ව්‍යාපෘති | - | 10,792,226 |
| ICTer සම්මන්ත්‍රණය | 1,624,264 | 147,339 |
| IDRC අතර්‍ය ගම්මානය | (65,175) | 95,992 |
| ව්‍යාපෘතිවලින් අතිරික්තය | 1,559,089 | 11,035,557 |
| තීක්ෂණ | 644,080 | 836,968 |
| ශුද්ධ අතිරික්තය/(හිඟය) | 75,145,031 | 98,289,177 |

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

කොළඹ විශ්වවිද්‍යාලය

2013 දෙසැම්බර් 31දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2013<br>රුපි. | 2012<br>රුපි. |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | |
| වර්ෂය සඳහා හිඟය/අතිරික්තය | 75,145,031 | 98,289,177 |
| ගැළපුම් | | |
| ක්ෂය - | 29,786,429 | 25,210,600 |
| පාරිතෝෂික වෙන්කිරීම | 4,693,425 | 4,407,740 |
| යටිතල පහසුකම් සඳහා සංචිත උපයෝජනය | (18,548,443) | - |
| විලම්බිත ආදායම් | (18,973,278) | (22,142,464) |
| ලැබුණු පෙර ප්‍රදානවලින් මාරුකිරීම | (5,689,864) | (10,901,365) |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලාභය | (358,575) | (96,450) |
| විනිමය ආදායම | (521,282) | (11,616,474) |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය | 65,533,443 | 83,150,764 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම් | 16,344,815 | 9,792,438 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඉපැයූ ශුද්ධ මුදල් | 81,878,258 | 92,943,202 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය | | |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම | (39,329,243) | (16,146,779) |
| යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාකාරකම් | (59,904,934) | (22,327,823) |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබූ මුදල් | 365,000 | 96,450 |
| දේපළ, පිරියත සහ උපකරණ පුනරුත්ථාපන සහ නඩත්තු | (3,775,562) | (1,905,331) |
| | (20,766,481) | 52,659,719 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය | - | - |
| ලද ප්‍රාග්ධන ප්‍රදාන | 71,371,616 | 19,150,000 |
| ලද ව්‍යාපෘති ප්‍රදාන | 7,105,427 | 5,639,052 |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති ශේෂවලින් මාරුකිරීම | (1,790,632) | (3,340,857) |
| ICTer සම්මන්ත්‍රණය | - | 1,191,152 |
| ගෙවූ පාරිතෝෂික | (934,588) | (227,160) |
| සීමා කළ අරමුදල්වලින් ලැබීම | 14,978,456 | 12,904,748 |
| මුදල් සහ මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 69,963,798 | 87,976,654 |
| විනිමය ආදායම/(අලාභය) | 521,282 | 11,616,474 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ | 581,102,523 | 481,509,395 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ | 651,587,603 | 581,102,523 |

## කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය
## මූල්‍ය කැපී පෙනීම්

| මූල්‍ය වර්ෂය | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 | රුපි. '<br>2006 |
|---|---|---|---|---|---|---|---|---|
| රාජ්‍ය ප්‍රදාන - පුනරාවර්තන | 90,383 | 91,802 | 83,102 | 65,381 | 68,610 | 71,555 | 78,695 | 52,850 |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | 25,759 | 19,150 | 16,000 | 4,920 | 4,167 | 11,055 | 10,560 | 36,740 |
| මුළු ලද රජයේ ප්‍රදාන | 116,142 | 110,952 | 99,102 | 70,301 | 72,777 | 82,610 | 89,255 | 89,590 |
| පුනරාවර්තන වියදම (විශ්වවිද්‍යාල වැඩසටහන) | 133,190 | 111,212 | 92,310 | 80,120 | 84,461 | 80,083 | 76,564 | 65,617 |
| ප්‍රාග්ධන වියදම් | 71,371 | 31,178 | 28,628 | 21,301 | 8,542 | 12,764 | 12,305 | 29,064 |
| මුළු වියදම (විශ්වවිද්‍යාල වැඩසටහන) | 204,561 | 142,390 | 120,938 | 101,421 | 93,003 | 92,847 | 88,869 | 94,681 |
| ඉපැයූ ආදායමින් දායකත්වය | 88,419 | 31,438 | 21,836 | 31,120 | 20,226 | 10,237 | - | 5,091 |
| ඉපැයූ දළ ආදායමින් දායකත්වය -% | 37% | 16% | 14% | 25% | 17% | 10% | 0% | 9% |
| ඉපැයූ ශුද්ධ ආදායමින් දායකත්වය -% | 63% | 28% | 28% | 62% | 35% | 18% | 0% | 21% |
| උත්පාදිත ආදායම | 242,025 | 194,230 | 159,429 | 123,267 | 115,690 | 105,426 | 68,494 | 58,981 |
| පුනරාවර්තන වියදම් ව්‍යාප්ති වැඩසටහන් | 102,173 | 82,390 | 80,197 | 73,313 | 58,399 | 47,316 | 40,117 | 35,141 |
| විදේශ අරමුදල් සැපයූ ව්‍යාපෘති සඳහා ලද ප්‍රදාන | 9,341 | 5,639 | 6,202 | 93,581 | 104,834 | 70,969 | 35,700 | 46,356 |
| අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව | 879 | 737 | 737 | 739 | 748 | 754 | 584 | 592 |
| සේවක සංඛ්‍යාව | 144 | 144 | 144 | 151 | 162 | 156 | 147 | 139 |
| වර්ෂයකට ශිෂ්‍යයකුට පුනරාවර්තන පිරිවැය ( '000 ) | 152 | 151 | 125 | 108 | 113 | 106 | 131 | 111 |
| වර්ෂයකට ශිෂ්‍යයකුට ප්‍රාග්ධන පිරිවැය ( '000 ) | 81 | 42 | 39 | 29 | 11 | 17 | 21 | 49 |
| වර්ෂයකට සේවකයකුට පිරිවැය ( '000 ) | 774 | 670 | 578 | 457 | 414 | 384 | 372 | 359 |

(1291)

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊසී/සී/යූසීඑස්සී/1/13/එෆ්ෆ්   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2015 මාර්තු 12 දින

අධ්‍යක්ෂ,

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය නියමාවලියේ 23 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

UNIVERSITY OF COLOMBO SCHOOL OF COMPUTING
FINANCE
24 MAR 2015
DIVISION

ඩබ්ලිව්.පී.සී .වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

පිටපත්:
1. ලේකම් - මුදල් අමාත්‍යාංශය
2. ලේකම් - මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති - කොළඹ විශ්වවිද්‍යාලය

DR
For your information pl.
24/3



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාව 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ගිණුම්කරණය සඳහා භාවිතා කරන පරිගණක මෘදුකාංග පද්ධතියේ දෝෂයන් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබු අතර, ඒ හේතුවෙන් හඳුනා නොගත් රු: 3,257,163 ක හර ශේෂයක් පොදු සංචිතයට හර කර තිබුණි.

| | |
|---|---|
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ශුද්ධ අගය රු.152,125,608 ක් වූ වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඈ) 2011 අප්‍රේල් 20 දිනැති අංක 1/2011 දරන උසස් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය | අධ්‍යයන කාර්යමණ්ඩල සඳහා ගෙවා තිබූ රු.5,620,750 ක පර්යේෂණ දීමනා චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව ගෙවූ බවට තහවුරු කරගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.75,145,031 ක අතිරික්තයක් වූ අතර, ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.98,289,177 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.23,144,146 කින් අඩුවීමට ආදායම වැඩිවීමට වඩා වියදම් රු.21,725,145 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ තථ්‍ය කාර්යසාධන වාර්තා පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 4.2 කළමනාකරණ ආකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් පරිදි මූලික පිරිවැය ඇස්තමේන්තුවක් සකස් නොකර, එකී සංග්‍රහයේ 7.9.11 පරිදි කාර්යසාධන හැකියාව පරීක්ෂා කිරීමකින් තොරව 2012 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය, පවතින මෘදුකාංග පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා ප්‍රසම්පාදන අංක UCSC/QUA/ADM/2012/134 යටතේ අසාමාන්‍ය අතාත්වික අනුප්‍රමාණයන් සහිත අවම ලංසුවකට ටෙන්ඩරය පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2013 ජනවාරි 31 දිනට අවසන් වාර්තා ආයතනය වෙත ඉදිරිපත් කළයුතු වුවත් එසේ කිරීමකින් තොරව රු.112,500 ක් 2013 ඔක්තෝබර් 30 දින එම ආයතනයට ගෙවා තිබූ අතර මෙම කාර්ය අදාල ආයතනය වෙතින් ඉටු කරවා නොගෙන ආයතනයේ කාර්යමණ්ඩලය යොදවාගෙන නැවත ඉටුකෙරෙමින් පැවතුණි.

(ආ) සීමාසහිත තීක්ෂණ සමාගම සමාලෝචිත වර්ෂය සඳහා රු.10,327,760 ක ආදායම් උපයා තිබූ අතර උපදේශන දීමනා වශයෙන් රු.7,129,852 ක් (සියයට 70) කාර්යමණ්ඩලය අතර බෙදා දී තිබුණි. සමාගමේ ස්ථාවර වත්කම් වටිනාකම රු.134,405 ක් වූ අතර එදිනෙදා කාර්යසාධනයේ දී තීක්ෂණ සමාගමේ පවතින වත්කම් අනුව මෙහෙයුම් කටයුතු සඳහා ආයතනයේ සම්පත් යොදා නොගත්තා බවට විගණනයේ දී බැහැර කළ නොහැකි විය.

## 05. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) වත්කම් පාලනය
(ආ) ගිවිසුම් හා බැඳුම්කර
(ඇ) ප්‍රසම්පාදන කටයුතු
(ඈ) අරමුදල් පාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

2015 අප්‍රේල් මස 30 වන දින

විගණකාධිපතිතුමා,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2002 අංක 1 දරන කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන නියමාවලියේ 23 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.**

2. මූල්‍ය ප්‍රකාශන
2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම
2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2013 වර්ෂයේ ආරම්භක රඳවා ගැනීම් ඉපයීම් හර ශේෂය වන රු. 986,823.27 සමන්විත වනුයේ පහත සඳහන් ශේෂ දෙකේ ශුද්ධ අගය වේ.

| | |
|---|---|
| රඳවා ගත් ඉපයීම් (Retained Earnings) (බැර) | 2,270,339.89 |
| Historical Balance (හර) | 3,257,163.16 |
| | **986,823.27** |

මෙය අප විසින් භාවිතා කරන ගිණුම්කරණ පැකේජයට අනුව පෙන්නුම් කරන සටහනකි.

කෙසේ නමුත් අදාළ නිවැරදි කිරීම් 2014 වර්ෂය ආරම්භයේදී සිදු කර ඇත.

(ආ) ස්ථාවර වත්කම් උපලේඛනය අනුව වර්ෂය තුළ සත්‍ය වශයෙන් මිලදී ගත් වත්කම්වල වටිනාකම පෙන්නුම් කරනු ලබන අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වත්කම් මිලදී ගැනීම් ලෙස දැක්වෙනුයේ සත්‍ය වශයෙන් වර්ෂය තුළ මුදලින් ගෙවූ ප්‍රමාණයයි.

**2.3** <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>
<u>අය නොවී පැවතුණ ණය ශේෂ</u>

| | නම | ශේෂය | ණය වර්ගය |
|---|---|---|---|
| 1. | එම්. එස්. පතිදරන් මයා | 137,648 | ආපදා ණය |
| 2. | එම්. එම්. ලක්ෂ්මන් මයා | 226,310 | ආපදා ණය |
| 3. | අයි. එම්. එස්. ප්‍රියලතා මිය | 218,067 | ආපදා ණය, වාහන ණය |
| 4. | එන් සී ජී ලියනගේ මයා | 24,100 | ආපදා ණය |
| 5. | එස්. සී. ජී. එම්. සිල්වා | 55,836 | ආපදා ණය |
| 6. | වයි. ඒකනායක | 90,000 | වාහන ණය |
| | | 751,961 | |

**1) එස් අයි පතිරදන් මයා ආපදා ණය රු. 137,648/-**

එස් අයි පතිදරන් මහතාගේ බැඳුම්කර ගිවිසුම කඩ කිරීම වෙනුවෙන් ඔහුට විරුද්ධව නඩු පවරා ඇත. එකී නීතිමය කටයුතු අවසානයේදී ඔහුගෙන් අය විය යුතු මුදලට ආපදා ණය ශේෂය වන රුත 137,648 ක මුදල ඇතුළත් කර ඇත.

**2) එන් එම් ලක්ෂ්මන් ආපදා ණය රු. 226,310/-**

2014.11.27 දින ඉහත ණය ශේෂය වන රු. 226,310 ක මුදලින් රු. 215,515 ක් ඔහුගේ අර්ථසාධක අරමුදලේ ශේෂයද ඉතිරි රු. 10,975/- ක මුදලක්ද ආයතනයට ගෙවා සම්පූර්ණ මුදල නිදහස් කර ඇත.

**3) අයි. එම්. එස්. ප්‍රියලතා මිය ආපදා ණය 190,067/- වාහන ණය රු. 28,000/-**

2014.11.17 දින අයි එම් එස් ප්‍රියලතා මහත්මියගේ අර්ථසාධක අරමුදලින් ඉහත ණය මුදල් වන ආපදා ණය රු. 196,067/- සහ වාහන ණය රු. 28,000/- අය කරලෙන ඉතිරිය නිදහස් කරන ලදී. එම නිසා 2014.11.17 වන විට අයි එම්. එස් ප්‍රියලතා මහත්මියගේ ණය මුදල වන රු. 218,067 ක මුදල සම්පූර්ණයෙන් අය කරගෙන ඇත.

**4) එන්. සී. ජී. ලියනගේ මයා ආපදා ණය රු. 24,100/-**

එන් සී ජී ලියනගේ මහතාගේ ආපදා ණය ශේෂය වන රු. 24,100/- ක මුදල ඔහුගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අය කර ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දැනුම් දී ඇත.

**5) එස් සී ජී එම් සිල්වා ආපදා ණය රු. 55,836/-**

එස් සී ජී එම් සිල්වාගෙන් අය විය යුතු ආපදා ණය ශේෂය වන රු. 55,836 ක මුදල ඔහුගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකරගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දැනුම් දී ඇත.

**6) වයි. ඒකනායක, වාහන ණය 90,000/-**

ඉහත වාහන ණය මුදල මාස්පතා අඛණ්ඩව අයවන අතර 2014.12.31 දිනට එහි ශේෂය රු. 68,000 කි.

**2.4 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ නීතිරීති වලට අනුකූල නොවීම**

(අ)අප ආයතනය මගින් පවත්වනු ලබන පශ්චාත් උපාධි පාඨමාලාවල ගුණාත්මක භාවය ආරක්ෂා කර ගැනීමට වෘත්තීය දේශකවරු යොදවා ගැනීමට සිදුවන බැවින් ඒ සඳහා අවශ්‍ය වන පැයකට රු. 4000 ක් බැගින් ගෙවීමට අනුමැතිය ඉල්ලීමක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමට යොමු කර ඇත. එකී ඉල්ලීම සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලිපි අංක UOC/HR/6/1/13(1) මගින් දැනුම් දී ඇත්තේ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා පැයකට ගෙවන උපරිමය අදාළ විශ්වවිද්‍යාලයේ පාලක සභාව මගින් තීරණය කළ යුතු බවයි.

කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයන ආයතනයේ සියලුම මූල්‍ය තීරණ ගනු ලබන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාව නොව පරිගණක අධ්‍යයන ආයතනයේ කළමනාකරණ මණ්ඩලය බැවින්, පශ්චාත් උපාධි දේශන සඳහා පැයකට ගෙවන මුදල තීරණය කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයන ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් සිදුකළ යුතුය යන තීරණය කරන ලදී. (මූල්‍ය ස්වාධීනත්වය ඇති නිසා)

2.4 (ආ)iආයතනය විසින් උපයන විවිධ පාඨමාලාවන් තුලින් නිශ්චිත ප්‍රතිශතයක් යොදාගෙන ගොඩනගන ලද වත්කම් ප්‍රතිසම්පාදන අරමුදල වේ. UCSC ආයතනයේ අධ්‍යයන කටයුතුවල ගුණාත්මක භාවය ඒ සඳහා භාවිතා කරන තාක්ෂණික උපකරන මත තීරණය වන අතර ඒ සඳහා ප්‍රමාණවත් මුදලක් භාණ්ඩාගාර ප්‍රතිපාදන තුළින් නොලැබෙන නිසා කළමනාකරණ මණ්ඩල අනුමැතියෙන් අදාළ අරමුදල ගොඩනගා ඇත.

2.4 (ආ)ii.ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පර්යේෂණ කිරීම සහ එහි ප්‍රතිඵල එළිදැක්වීම, පර්යේෂණ ප්‍රතිඵල ජාතික හා ජාත්‍යන්තරව ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය වන අරමුදල් ප්‍රමාණවත් මුදලක් භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ නොලැබෙන නිසා ආයතනය විසින් උපයන බාහිර උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලාවලින් යම් ප්‍රතිශතයක් මාරු කර අදාළ අරමුදල පිහිටුවීම කළමනාකරණ මණ්ඩල අනුමැතිය යටතේ සිදුකළ අතර එකී අරමුදල් වියදම් කිරීමේ නීතිරීති මාලාවද කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර එකී නීතිරීති මාලාවට අනුව අදාළ වියදම් දරා ඇත.

ඇ.ආයතනයේ ස්ථාවරව වත්කම් ලේඛනයේ සියලු මිලදී ගැනීම් නිසි ලෙස ඇතුළත් කර ඇති අතර ආයතනයෙන් ඉවත් කරන ලද වත්කම් ලේඛනයේ ඉවත් කිරීම සිදු කර නොමැත.

2015 වසර ආරම්භයේදී ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම, වත්කම් අංක කිරීම, පරිගණක කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීම සහ වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා නිසි අනුමැතිය ලබාගෙන මිල ගණන් කැඳවීම සඳහා කටයුතු සිදුකරමින් පවතී.

ඈ.අධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා පර්යේෂණ දීමනාව ගෙවීම 2011 අප්‍රේල් 20 වන දින චක්‍රලේඛ අංක 1/2011 ට අනුකූලව සිදුකළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

කාර්යසාධනය පිළිබඳ වාර්තාව හා ලිපිලේඛන 2014 දෙසැම්බර් 22 දින රජයේ විගණන අධිකාරි වෙත ලබා දී ඇත.

4.2 (අ) 2012 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය, ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සහ bar code සහිත ස්ටිකර් ඇලවීම ඇතුළු කාර්යය සඳහා මිල ගණන් කැඳවන ලද අතර ඒ සඳහා ඉදිරිපත් කල ලංසු අතරින් අවම ලංසුව සහිත මාගමගේ සහ සමාගම (වරලත් ගණකාධිකාරිවරු) තමන් විස්තර සිදු කරන ලද සමාන ගිවිසුම් පිළිබඳ විස්තර ලබා දී තිබූ අතර ඒ පිළිබඳව නිසි ලෙස විමර්ශනයකින් පසුව සෑහීමකට පත්වූ නිසා අදාළ ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා පත්කල තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කළ අතර ඊට අනුව ඔවුන්ට ගිවිසුම පිරිනමන ලදී.

2013 වසරේ ඔක්තෝබර් මස වන විට අදාළ කොන්ත්‍රාත්තුව අනුව නිමකළ යුතු වැඩ කොටස් වලින් වැඩි ප්‍රමාණයක් නිම කර (draft report) ලබා දි ඇති නිසාත් ඉතිරි වැඩ කොටස් නිම කිරීම සඳහා සම්පූර්ණ මුදල ලබා දෙන ලෙස ඉල්ලීම් කළද අදාළ ඉල්ලීම් සලකා බැලීම සඳහා රැස් වූ තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත කොන්ත්‍රාත් මුදලින් 50% ක් පමණක් ගෙවීමට නිර්දේශ කරන ලදී.

(ආ) (i)ගිවිසුම් කඩකළ ආචාර්යවරයෙකු වන ආර්. කේ. රාජපක්ෂ මහතාගෙන් අදාළ මුදල අයකර ගැනීම පිණිස නීතිපතිතුමා වෙත අධ්‍යක්ෂකතුමා විසින් 2006.02.10 දින යවන ලද ලිපියට අනුව නීතිපති දෙපාර්තමේන්තුව විසින් කොළඹ දිසා අධිකරණයේ අංක DMR/07249/2010 යටතේ නඩු පවරා තිබුණි. එම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී. එකී නඩුව 2014.12.09 දින ද 2015.03.06 කැඳවා තිබූ අතර නැවත 2015.05.05 දින කැඳවා ඇත. මෙම ආචාර්යවරයා ගිවිසුම් කඩ කළ මුදල ගෙවීමට එකඟ වී නැත. ඔහු අධිකරණයට දන්වා ඇත්තේ ඔහුගේ ගිවිසුමට ඇතුළත් කරන ලද ගුවන් යානා පත්‍ර ගාස්තුවෙන් (යාම සහ ඒම) අඩක් හැර ඉතිරිර මුදල් ගෙවීමට එකඟ බවයි. ඊට හේතුව එහු නැවත ලංකාවට නොපැමිණි නිසයි. නමුත් ගුවන් යානා ගාස්තුව ගිවිසුමට ඇතුළත් වන නිසා එම මුදල ලබාගැනීම පිණිස නඩුව තවදුරටත් විභාග වෙමින් පවතී

(ii) එස්. ජේ. පහීරදන් ආචාර්යවරයා ගිවිසුම කඩකර විදේශගතවීම හේතුවෙන් ඔහුට එරෙහිවද නීතිපති දෙපාර්තමේන්තුව විසින් අංක DMR/07902/2010 යටතේ පවරා ඇත. නමුත් ඔහු පදිංචි ලිපිනය හැර දැමීම නිසා නඩුව ඉදිරියට ගෙන යාමට නොහැකිව නඩු ලිපි ගොනුව අධිකරණයේ ඇත. මොහු පදිංචිව හෝ සිටින ස්ථානය

සොයා ගැනීමට ආයතනයේ පරිපාලනය විවිධ උත්සාහයන් දරා ඇතත් එය ව්‍යර්ථ වී තිබේ. කරුණු මෙසේ තිබියදී 2014 වසරේ දෙසැම්බර් මාසයේ දිනක ඔහු ලංකාවට පැමිණි බවට තොරතුරු වාර්තා වීම නිසා ඔහු නැවත රටින් පිටවීම වළක්වාලීම පිණිස මේ පිළිබඳව ආගමන විගමන පාලකවරයාට දුරකථනයෙන් දැනුම් දෙන ලදී. එම අවස්ථාවේ ආගමන විගමන පාලකවරයා විසින් පතිරදන් මහතාගේ ජීව දත්ත තොරතුරු පරීක්ෂා කොට ඔහු ලංකාවට නොපැමිණි බව තහවුරු කරන ලදී.

නමුත් පතිරදන් මහතා ලංකාවට පැමිණි බව දැක ඇති අය සිටින බව ආගමන විගමන පාලකවරයාට දැන්වූ විට මොහු සඳහන් කර ඇත්තේ පතිරදන් මහතා වෙනත්රටකට අයත් ගුවන් ගමන් බලපත්‍රයක් මගින් වෙනත් නමකින් පැමිණවීමට හැකි බවත් ඒවා වළක්වාලීමට දැනට පවතින ක්‍රමවේදය ශක්තිමත් නොවන බවය. සිද්ධිය පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවට දැන්වූ විට නඩුව භාර රාජ්‍ය නීතිඥතුමිය දුරකථනයෙන් දන්වා ඇත්තේ මේ පිළිබඳව වංචා විමර්ශන කාර්යාංශය වෙත දන්වා ඉදිරි නීති පියවර ගන්නා ලෙසයි. එකී උපදෙස් පරිදි ඔහුට එරෙහිව කොළඹ කොට්ඨාශය භාර වංචා විමර්ශන අංශයේ පැමිණිල්ලක් දමා ඇති අතර ඔවුන් විසින් අධිකරණයට කරුණු දන්වා ඉදිරි විමර්ශන සිදු කෙරෙමින් පවතී. මීට සමගාමීව පතිරදන් මහතාට එරෙහිව අන්තර් ජාතික රතු වරෙන්තුවක් නිකුත් කරවා ගැනීමට අවශ්‍යය කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරේ.

(ඈ) බැඳුම්කරය අත්සන් කරනු ලබන්නේ ආචාර්යවරුන් විදෙස්ගත වීමට පෙරාතුව වේ. මෙම මුදල වෙනස් නොවේ. නමුත් ඔහු / ඇය බැඳුම්කරය කඩකළ විට අදාළ මුදල් අය කරගැනීමට කාලය ගත වේ. ඇතැම් අවස්ථාවල ඔහුගේ පදිංචි ලිපිනය අතහැර යාම හෝ ඔවුන් පුස්තකාලයෙන් ලබාගත් පොත් නැවත ලබා නොදීම නිසා අදාළ මුදල් අයකරගැනීම හෝ ඔවුන්ට එරෙහිව නඩු පැවරීම නිසා කාලය ගත වීම පරිපාලනයෙන් බැහැර කරුණකි. මෙකී හේතු නිසා කාලය ගතවන විට අදාළ ගිණුම් වල ශේෂය වර්ධනය වේ. දැනට මේ සම්බන්ධයෙන් ලැබී තිබෙන උපදෙස් හා මැදිහත්වීම් ප්‍රමාණවත් නොවන නිසා මෙවැනි ගැටලු ඇති වී තබෙන බව කරුණු විමර්ශනයෙන් තහවුරු විය. මෙම ප්‍රශ්නයට විසඳුම් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේද සහාය ඇතිව ඒ ඒ සේවක භවතාගේ සේවය අවසන් වූ පසුව වහාම ඔහුගේ / ඇයගේ අර්ථසාධක අරමුදල නිදහස් කිරීමට සහ ගිවිසුම් කඩකළ අය වෙතොත් ඔවුන්ගේ අර්ථසාධක අරමුදලේ ශේෂය අක්‍රිය කිරීමට පියවර ගෙන ඇත.

(ඈ) ගිවිසුම් කඩකළ අයවලුන්ට එරෙහිව කඩිනමින් නීති පියවර ගෙන ඇත. නමුත් නීතිය ක්‍රියාත්මක කරවීමට යෑමේදී ඇතැම් අවස්ථාවල වසර 1 සිට කීපයක් ගත වී ඇති බව ලිපි ගොනු පරීක්ෂාවේදී තහවුරු විය.

## 4.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පරිහරණයට ගත නොහැකි භාණ්ඩ ගණන් දීමේ නිලධාරී විසින් පත් කරනු ලැබූ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත අපහරණය කරන ලදී. අදාළ වත්කම් හඳුනාගෙන ඒවා ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට පියවර ගෙන ඇත. ඉදිරි වර්ෂයේදී මෙවැනි ගැටලුවක් ඇති නොවීමට හා වත්කම් හඳුනාගැනීමේ අංක ක්‍රමයක් හඳන්වා දීමට කටයුතු කරමින් පවතී. මෙහි ප්‍රගතිය හා අවසන් ප්‍රතිඵල පිළිබඳව විගණකාධිපතිතුමා වෙත වාර්තා කිරීමට කටයුතු කෙරේ.

## 4.4 නිෂ්ක්‍රිය අරමුදල්

නිෂ්ක්‍රිය අරමුදල් ලෙස දක්වා ඇති සියලුම අරමුදල් ඒ ඒ අරමුදල් සමායෝජකයන්ගේ නිර්දේශ සහිතව කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2015 ආරම්භය වන විට භාවිතා කර ඇත.

4.5 සීමිත තික්ෂණ සමාගම

(අ) කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ නිර්මාතෘ විද්‍යාජෝති මහාචාර්ය වී.කේ. සමරනායක මහතාගේ පහත සඳහන් නිර්දේශයන් මත කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන කළමනාකරණ මණ්ඩලයේ දීර්ඝ ලෙස කරන ලද කරුණු සොයා බැලීමකින් අනතුරුව මෙම සීමිත තීක්ෂණ සමාගම පිහිටුවන ලදී.

(I) ජාත්‍යන්තර තලයේ විශ්වවිද්‍යාල විසින් තම පර්යේෂණ ප්‍රතිඵල වාණිජකරණය (Commercialization) කිරීමේ ලා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය අප විසින් ද අනුගමනය කළ යුතු බවට කරන ලද යෝජනාව

(II) ජාත්‍යන්තර මූලධන සම්පාදක ආයතනය වන ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව, හා එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ක්‍රියාත්මක වන ආයතන විසින් පවත්වා ගෙන යනු ලබන විදේශ ව්‍යාපෘතිවල උපදේශන සේවා ලබා ගැනීමේ අරමුණ ඇතිව මෙවැනි සමාගමක් පිහිටුවන ලෙසට උපදෙස් දෙන ලදී. එනම් ශ්‍රී ලංකාව තුළ යුධ වාතාවරණයක් පැවති සමයේ මෙකී උපදේශන සේවාවන් ශ්‍රී ලංකා රජයට සම්බන්ධ ආයතනයක් වන (UCSC) හරහා කිරීමට, එකී ආයතන අකමැත්ත පළ කරන ලද හෙයින්

(III) එසේම ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති අනෙකුත් සහෝදර විශ්වවිද්‍යාල විසින්ද මෙම සංකල්පය අනුගමනය කරන ලද හෙයින්,

(IV) විශ්වවිද්‍යාලය තුළ අධ්‍යයන කටයුතු හදාරන අභ්‍යන්තර ශිෂ්‍යයන් සඳහා අවශ්‍ය පුහුණුව හා පළපුරුද්ද (Internship) ලබා දීමට

(V) පෞද්ගලික අංශයේ උපදේශන සේවා සපයනු ලබන ආයතනය හා තරඟකාරීව උපදේශ සේවා වෙළඳපොළ වාසි අත් කර ගැනීමට

මෙයට අමතරව මෙම සමාගම විසින් ශ්‍රී ලංකා රජයට පරිගණක තාක්ෂණය හා උපදේශන සේවා රැසක් සපයා දී ඇති අතර ඒ මත ICT ඒජන්සිය හරහා ගොඩනගා ගන්නා ලද සබඳතා තුළින් මෙන්ම ප්‍රකට මෘදුකාංග සංවර්ධන සමාගම් හා උපදේශකයින් සමග සම්බන්ධ වී ජාත්‍යන්තර උපදේශන හා සේවා ලබාගෙන ඇති අතර, ඒ තුළින් ඇමෙරිකානු ඩොලර් ලක්ෂ දෙකක් පමණ විදේශ විනිමය ද උපයාගෙන ඇත.

මෙවැනි බොහෝ කාර්යයන් සිදුකිරීමට හැකියාව ලැබී ඇත්තේ මෙම සමාගම සමග ගනුදෙනු කිරීමට තුන්වන පාර්ශ්වයක් තුළ තිබූ කැමැත්ත මත වන අතර මෙම සමාගම කිසිදු ආකාරයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක සේවා මධ්‍යස්ථානය (CSC) සමග තරඟකාරී ආයතකනයක් නොවන බව ඉතා පැහැදිලිව දන්වා සිටිමි.

එසේම අවසාන වශයෙන් අයාතනයට ලැබෙන උපදේශන සේවා පරිගණක සේවා මධ්‍යස්ථානයේ හෝ තීක්ෂණ සමාගමේ ලබාදෙනු ලැබුවද අවසාන ප්‍රතිඵලය UCSC ආයතනය යටතේ ඒකාබද්ධ සංචිතයට බැරවීමක් සිදු වේ.

එසේම 2002 අංක 01 දරන නියමාවලියේ තුන්වන (3) වගන්තියේ (ඕ) උප වගන්තියට අනුව අධ්‍යයනායතනයේ පරමාර්ථ හා අරමුණු ඉටු කර ගැනිම පිණිස එකී බලතල, කාර්ය හා කර්තව්‍යවලට ආනුෂංගික හෝ ඒ හේතුවෙන් අවශ්‍ය වන වෙනත් සියලු දේ කිරීමට බලය ඇත්තේය.

ඒ අනුව මෙම සීමිත තීක්ෂණ සමාගම පිහිටුවා ඇති අතර එය පරිගණක සේවා මධ්‍යස්ථානයට තරගකාරී ආයතනයක් ද නොවේ.

(ආ) පරිගණක තාක්ෂණ උපදේශන සේවා ලබාගැනීමේදී බහුලව භාවිතා කරනු ලබන්නේ භෞතික සම්පත් වෙනුවට බුද්ධිමය සම්පත් වන බැවින් විශාල ප්‍රමාණයක වත්කම් අවශ්‍යතාවයක් පැන නොනගී. එසේම අප විසින් බොහෝ අවස්ථාවලදී අදාළ සේවාදායක ස්ථානයේ භෞතික සම්පත් භාවිතා කරමින් උපදේශන සේවාවන් සැපයීමට කටයුතු කර තිබේ. සමහර මෘදුකාංග සංවර්ධනය කිරීමේදී මෘදුකාංග ඉංජිනේරුවන් අදාළ සේවා දායක ස්ථානයේ ස්ථිරවම රැඳී සිටිමින් මෘදුකාංග සංවර්ධන ක්‍රියාවලියේ නිරතව සිටී.

එසේම ආයතනය විසින් පහත සඳහන් පරිදි පරිගණක යන්ත්‍ර හා අනෙකුත් වත්කම් අත්පත් කරගෙන ඇත.

| | | |
|---|---|---|
| 2009.05.11 | පරිගණක 2 | 159,000.00 |
| 2011.06.28 | පරිගණක 2 | 157,950.00 |
| | | 316,950.00 |

මේ අනුව අප වෙත ඇති වත්කම් ප්‍රමාණය මෙහෙයුම් කටයුතු සඳහා ඉතා ප්‍රමාණවත් බව සඳහන් කරනු කැමැත්තෙමි.

05.සටහන් කර ගතිමි.

ස්තුතියි,

මෙයට - විශ්වාසී,

මහාචාර්ය ජී. එන්. වික්‍රමනායක

අධ්‍යක්ෂ

කොළඹ විශ්වවිද්‍යාලයීය

පරිගණක අධ්‍යයනායතනය

පිටපත් -

1. ලේකම් - මුදල් අමාත්‍යාංශය
2. ලේකම් - මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති - කොළඹ විශ්වවිද්‍යාලය